# වයඹ පලාත් පාලන දෙපාර්තමේන්තුව

# වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

**2023 වර්ෂයේ /60 වන සභා වාරයේ මහා සභා රැස්වීම් වාර්තාව -කෙටුම්පතකි**

## 2023-02-09

## පැමිණීම

1. ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතා
2. ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා
3. ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා
4. ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා
5. ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා
6. ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා
7. ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය
8. ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා
9. ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා
10. ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
11. ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය
12. ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය
13. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා
14. ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා
15. ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා
16. ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා
17. ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා
18. ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා
19. ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා
20. ගරු මන්ත්‍රී එල්. සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
21. ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා
22. ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා
23. ගරු මන්ත්‍රී ඩබ්.සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
24. ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය

25. ගරු මන්ත්‍රිනී පී.එම්.ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය
26. ගරු මන්ත්‍රිනී ඩබ්.දුලක්ෂි වමෝදරී ප්‍රනාන්දු මහත්මිය
27. ගරු මන්ත්‍රී වී.ඒ.වර්ණ රංග ගුණසේකර මහතා
28. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා
29. ගරු මන්ත්‍රිනී ඒ.එම්.චමිලා දිල්රුක්ෂිකා මහත්මිය
30. ගරු මන්ත්‍රී අයි.බී.සැම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා

මෙදින පෙ.ව.10.00ට මහා සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ විය.

ආගම සිහිකිරීමෙන් අනතුරුව මහා සභා රැස්වීම සඳහා සහභාගී වී සිටින ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්/තුමියන් හා සහභාගී වී සිටින ලේකම්මහතා හා එම නිලධාරීන් ඇතුළු සියළු දෙනාම මහා සභා රැස්වීම සඳහා ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදී.

## 01. 2023-01-12 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.

තීරණ අංක 01

2023-01-12 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී ඩබ්.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

- ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව පසුගිය මහා සභාව අවස්ථාවේදී පෞද්ගලික හේතුවක් මත තමන් පෙරවරු 11.30ට පමණ ලේකම් මහතාද දැනුවත් කර සභා රැස්වීමෙන් පිටව ගිය බවත්, එම අවස්ථාවේදී තීරණ අංක 20 යටතේ තීරණයක් ගෙන ඇති බවත් ප්‍රකාශ කරන ලදී.එය යටගිය ගැටළුවක් බවත්,විරෝධතාවයක් නොමැතිනම් පාරට නමක් දැමිය හැකි බවත්, ගරු මන්ත්‍රී කේ.එන්.සුදත් ජානක පෙරේරා මහතා කොට්ඨාසය භාර මන්ත්‍රීවරයා වුවත් මෙම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා විසින් ඉදිරිපත් කර ඇති බවත්,ඒ සඳහා සභාවේ අනුමැතියද ඒකමතිකව ලැබී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. මෙය වැරදි පූර්වාදර්ශයක් බවත්, කොට්ඨාසයක මාර්ගයකට නමක් දමන්නේ නම් කොට්ඨාස භාර මන්ත්‍රීවරයා නාමලේඛණය ගෙන ග්‍රාම නිලධාරී අත්සනද සහිතව මාර්ගය නම් කල යුතු බවට සභාවේදීම යෝජනාවක් ගෙන ආ බවත් ප්‍රකාශ කරන ලදී.තමන් වසර ගණනාවකට පෙර මෙම ප්‍රදේශයේ ඉඩමක් කට්ටි කල බවත්, මෙම ප්‍රදේශයේ සිතියමද සභාවට ඉදිරිපත් කරමින් මෙම අහස්දියවලට මුළු ලුණුවිල ප්‍රදේශයේම ජලය ගලාගෙන එන බවත් ඒ හරහා ලුණුවිල වැවට ජලය ගමන් කරන බවත් පෙන්වා දෙන ලදී. මෙම අහස්දිය වලින් විශාල ප්‍රමාණයක් මේ වන විට ගොඩ කර ඇති බවත් මේ සම්බන්ධයෙන් ලිපිද යොමු කර ඇති බවත්,මෙම අහස්දිය වල ගොඩ කලහොත් සභාවේ පුස්තකාලය යටවන බවත් ප්‍රකාශ කරන ලදී.මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන ලෙසට ලේකම් මහතාටද ලිපි ඉදිරිපත් කර ඇති බවත් ඒ පිළිබඳව පරීක්ෂණයක් කර සුදුසු පියවරක් ගන්නා ලෙසත් ඉල්ලා සිටින ලදී.

  මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කිරීමට වැඩ අධිකාරී මහතාව නම් කර ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

  කොට්ඨාස මන්ත්‍රීවරයාම මෙය යෝජනා කිරීමට අවශ්‍ය නොවන බවත්,2022 වර්ෂයේ මාර්තු මස මේ සම්බන්ධයෙන් තීරණයක් ගෙන ඇති බවත් ඒ පිළිබඳව තමන් කතා කල බවත්, ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.කොට්ඨාසභාර මන්ත්‍රීවරයෙකුම මෙය ඉදිරිපත් කල යුතු බවට පණත් වල ලියවී නොමැති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

  කොට්ඨාසභාර මන්ත්‍රීවරයා ඉදිරිපත් කල යුතු බවට තීරණයක් ගත් බවට තම මතකයේ තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

  ඝෝෂාව......

2022 මාර්තු මස මෙම යෝජනාව ඉදිරිපත් කර ස්ථිර වී ඇති බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී. එම ස්ථිර වී ඇති නමුත් එය ක්‍රියාත්මක නොවන්නේ ඇයිදැයි ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්රමසිංහ මහතා මෙහිදී විමසූ බවත් ප්‍රකාශ කරන ලදී.

ඒ සඳහා විරෝධතාවයක් තිබූ බැවින් එය පමා වී ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

විරෝධතාවයක් නොමැති නම් නාම පුවරුව ගැසීමට අවසර දී ඇති බවත්,මෙහි තිබෙන ගැටළුව බලා ඒ සම්බන්ධයෙන් කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධව පැමිණිල්ලක් ඉදිරිපත් වී තිබූ බවත්,විරෝධතාවය බලා අවශ්‍ය කටයුතු සිදු කිරීමට වැඩ අධිකාරීමහතාටද දැනුම් දී ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

වලක් ගොඩ කිරීමට අදාල ගැටළුව සහ මාර්ගය නම් කරන ගැටළුව යන දෙක වෙන වෙනම විසඳන ලෙසට ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

වලක් ගොඩ කිරීම පිළිබඳව සභාවට ලිඛිතව ගැටළුවක් පැමිණ නොමැති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ලිඛිතව පැමිණිල්ලක් දුන් බව ගරු මන්ත්රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධයෙන් වැඩ අධිකාරී මහතාගෙන් විමසීමේදී දින දෙකකට පෙර පැමිණිල්ලක් ඉදිරිපත් කල බව එම මහතා ගරු සභාපතිතුමාට පවසා සිටින ලදී. සැම දෙනාම සොයා බලා කතා කරන ලෙස ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා තමාගෙන්ද විමසීමක් කල බවත් ප්‍රකාශ කරන ලදී.අවශ්‍ය කටයුතු වැඩ අධිකාරී මහතා සහ ලේකම් මහතා විසින් සිදු කරන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.මේ සඳහා කොට්ඨාසභාර මන්ත්‍රීවරයාගේද නිර්දේශයක් ගෙන මෙම කටයුතු සිදු වන බවත් ප්‍රකාශ කරන ලදී.

- මෙම වාර්තාවේ 8 වන පිටුවේ නිවාඩු අනුමත කිරීම යටතේ දෙසැම්බර් මස පොදු පහසුකම් කමිටුවට නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නම් ලැයිස්තුව දෙවරක් සඳහන් කර ඇති බවත්,නමුත් මන්ත්‍රීවරුන්ගේ නම් වල වෙනසක් තිබෙන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී 2022 දෙසැම්බර් 01 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභාව ලෙස නම වෙනස් විය යුතු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

- අප සභාවේ විදෙස්ගත වී සිටින මන්ත්‍රීවරුන්ට නිවාඩු අනුමත කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී.මාස ගණනාවක සිට නිවාඩු අනුමත කරන බවත් ප්‍රකාශ කරන ලදී.මේ සඳහා කොමසාරිස්තුමාගෙන් උපදෙස් ගෙන කටයුතු කරන ලෙසත්,එතෙක් දීමනාව ගෙවීම නතර කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව අද දින මෙම රැස්වීමට සහභාගී නොවීමට නිවාඩු අනුමත කිරීම වෙනම කාරණයක් බවත්,නමුත් විදෙස්ගත වී සිටින විට සභික ධූරයේ කටයුතු ක්‍රියාත්මක නොවන බැවින් ඒ නිසා මේ සඳහා පලාත් පාලන කොමසාරිස්තුමාගෙන් උපදෙස් ගැනීම සුදුසු බවත්,රීති වලද මේ සම්බන්ධයෙන් කිසිවක් සටහන් වී නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.දිගටම සභාවෙන් නිවාඩු අනුමත කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන්ද තම අදහස් ඉදිරිපත් කරන ලදී.

මේ සඳහා අවශ්‍ය උපදෙස් කොමසාරිස්තුමාගෙන් ලබා ගැනීම සුදුසු බවත් තීරණය කරන ලදී.

මන්ත්‍රීවරයා නිශ්චිත කාලයකට නිවාඩු අනුමත කරගෙන නොමැති බවත්,විදෙස් ගත වන්නේ නම් මාසයකට දෙකකට හෝ කාලයක් සඳහන් කර එම මන්ත්‍රීවරයා විදෙස්ගත විය යුතු බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී දීමනාව ගෙවලාද,නැතිනම් නොගෙවාද යන්න පිළිබඳව දැනගත යුතු බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

මේ දක්වා ගෙවා ඇති බවත්,උපදෙස් ගන්නා තෙක් අද දින සිට ගෙවීම නතර කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මාස තුනකට නිවාඩු සභාව මඟින් අනුමත කරගෙන විදෙස් ගත වුවහොත් දීමනාව ගෙවන්නේද යන්න ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා විමසා සිටින ලදී.

සභික ධූරයේ කටයුතු ක්‍රියාත්මක නොවන බැවින් ඒ සම්බන්ධයෙන්ද කොමසාරිස්තුමාගෙන් උපදෙස් ලබා ගැනීමට සිදු වන බව ලේකම් මහතා විසින් පැහැදිලි කරදෙන ලදී.

- ගරු සභාපතිතුමා විසින් පසුගිය මස ගරු මහා සභාවේදී සාකච්ඡා කල කරුණු වල ප්‍රගතියද ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.විශේෂයෙන්ම දන්කොටුව කඩ කාමර සම්බන්ධයෙන් යම් ගැටළුවක් තිබේනම් වැඩ අධිකාරි මහතාගෙන්ද විමසීමක් කල හැකි බවත් දැනුම් දෙන ලදී.

එක් එක් කඩ කාමර සම්බන්ධයෙන් අදාල ලිපි ගොණු ගෙන පරීක්ෂා කර බලා අවසන් තීරණයක් ගැනීම සුදුසු බවට සාකච්ඡා කල බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

සභාව ඉදිරිපස පුවරුව සම්බන්ධයෙන් ආකෘතිය එවා තිබූ බවත්,එය ක්‍රියාත්මක වන්නේදැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ජේ.ඒ.ඩී.ඒ.පී.එස්.ජයසූරිය මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

එම මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව මෙම ආකෘතිය සකස් කර තාක්ෂණ අංශයට භාර දි ඇති බවත්,එම අදාල කඩ කාමර කීපයක් සමඟද කතා කල බවත් ඔවුන්ගේ වියදමින් ඒවා ස්ථාපිත කර ගන්නා ලෙසට ඔවුන්ට දැනුම් දුන් බවත් නමුත් සභාවේ ආකෘතියක් ඒ සඳහා තිබෙන බවත් ඒ අනුව සියළුම පුවරු ඉදි කල යුතු බවත් ප්‍රකාශ කරන ලදී.සභාවේ ලෝගෝ එක සහ නම ඉහළින්ම දිස් වන ලෙස එය සකස් කර පහළින් අනෙක් නම් දිස් වීමට සකස් කරන බවත් ප්‍රකාශ කරන ලදී.

සභාවේ ලෝගෝ එක ලෙස වයඹ අභිමානය දමා ඇති බවත්, ප්‍රාදේශීය සභාවේ ලෝගෝ එකද දැමූවේ නම් හොඳ බවත් අපගේ අනන්‍යතාවය එය බවත් වන්නේදැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

කඩ කාමර කීපයක් තිබෙන බවත්,එහිදී ඔවුන්ට ලබා දෙන ප්‍රමාණය එක හා සමාන විය යුතු බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

ඉහළ සිට පහළට බෝඩ් ස්ථාපිත වන බවත්,එවිට පහළින්ම තිබෙන බෝඩ් එක නොපෙනී ගියහොත් වලක් නොවන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

කිසිවෙකුටත් අසාධාරණයක් නොවන ලෙස එය සිදු කල යුතු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ආකෘතියේ ඉඩ තිබෙන ලෙස එක හා සමාන ප්‍රමාණයන් ඔවුන්ට ලබා දිය හැකි බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.ක්‍රියාත්මක වන කඩ කාමර වලට මූලිකත්වය දිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

මෙහි පිළිවිතරක් සකස් කර ඉදිරිපත් කරන බව ජේ.ඒ.ඩී.ඒ.පී.එස්.ජයසූරිය මහතා ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම වයික්කාල නුරාණී ඉඩමේ ගස් ඉවත් කිරීම පිළිබඳව තීරණයක් ගෙන තිබෙන බවත්,වටිනා ගස් තිබෙන බැවින් නීත්‍යානුකූලව දැනගෙන මිස මේ සම්බන්ධයෙන් කටයුතු නොකල යුතු බවත්,පළමුව ඉඩම පවරාගෙන ඉන් පසුව එම කටයුතු සිදු කිරීම සුදුසු බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව මෙය සභාවට පැවරී නොමැති බවත්,පවරා දීමට කටයුතු කරන බවට පවසා ඇති බවත් ප්‍රකාශ කරන ලදී.මේ සම්බන්ධයෙන් තමන් ප්‍රාදේශීය ලේකම්තුමිය සමඟද සාකච්ඡා කල බවත් දැව සංස්ථාව මඟින් එය ඉවත් කර දෙන ලෙසට එතුමිය පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී සූර්ය පැනල සම්බන්ධයෙන්ද සාකච්ඡා කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ජේ.ඒ.ඩී.ඒ.පී.එස්.ජයසූරිය මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

එම මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව 90% පමණ ණය මුදල ලබා ගැනීමේ කටයුතු අවසන් වී ඇති බවත්,පෙබරවාරි 24 වන දින මෙය කමිටුවට දමන බවට පැවසූ බවත් බොහෝ විට එහිදී මේ සඳහා අනුමැතිය ලැබෙයැයිද ප්‍රකාශ කරන ලදී.

විදුලිය නොමැති විට ඔන් වන ස්විචයක් තිබෙන බවත්,මිල අඩු වීම තුළදී එය දමන බවට පැවසූ බවත් එයද මේ සඳහා ඇතුළත් වී තිබේදැයි විමසා සිටින ලදී.

එය සකස් කරන බවට එතුමා පැවසූ බවත්, තවමත් අවසන් කර ලබා නොදුන් බවත් වැඩ අධිකාරී මහතා ප්‍රකාශ කරන ලදී.

## 02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

01. මැතිවරණය සම්බන්ධ චක්‍රලේඛ අංක 20 හා අංක 37 නිකුත් වී ඇති බව සභාව දැනුවත් කරන ලදී.
ඒවා සභාගත කරන ලෙසට ගරු මන්ත්‍රීවරුන් ඉල්ලා සිටින ලදී.

02. නිවාඩු අනුමත කිරීම

a) මහා සභාව සඳහා නොපැමිණෙන ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

තීරණ අංක 02

මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දන්වා නිවාඩු අයදුම්කර ඇති පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සඳහා ගරු සභාපතිතුමා ඉදිරිපත් කල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

1. ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා
2. ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා
3. ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා
4. ගරු මන්ත්‍රිනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මිය
5. ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා
6. ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා
7. ගරු මන්ත්රිනී එම්.එම්.මේරි.වාලට් කුරේ මහත්මිය
8. ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා
9. ගරු මන්ත්‍රී එස්.එම්.සුදත් චන්දන මහතා
10. ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා
11. ගරු මන්ත්‍රී එස්.එම්.දර්ශන දිමුතු කුමාර සුහසිංහ මහතා

b) මහා සභා රැස්වීම සඳහා දීර්ඝ කාලයක් සහභාගී නොවී නිවාඩු අනුමත කල පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරයාගේ හා ගරු මන්ත්‍රීවරියගේ නිවාඩු අනුමත කිරීම

තීරණ අංක 03

නිවාඩු අනුමත කලද මහා සභා රැස්වීම සඳහා මාස 03කට වඩා සහභාගී නොවූ පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරයාගේ හා ගරු මන්ත්‍රීවරියගේ නිවාඩු අනුමත කිරීම සුදුසු නොවන බවත්,එම ගෙවීම සාධාරණ නොවන බවත් ගරු මහා සභාව විසින් සාකච්ඡා කොට ඒකමතිකව අනුමත කරන ලදී.

- ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා
- ගරු මන්ත්‍රීනී ආර්.පී.නදීකා රණවීර මහත්මිය

c) කාරක සභා සඳහා නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

තීරණ අංක 04

2023 ජනවාරි මස  පැවති පහත සඳහන් කාරක සභා සඳහා සහභාගී නොවූ පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

**2023 ජනවාරි මස 12 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු  මහතා |
| 3. | ගරු මන්ත්රිනී නිරෝෂා ජීවන්ති ප්රනාන්දු මහත්මිය |
| 4. | ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා |
| 5. | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| 6. | මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |

**2023 ජනවාරි මස 24 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 4. | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |

**2023 ජනවාරි මස 20  වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 2. | ගරු මන්ත්රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා |
| 3. | ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා |
| 4. | ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා |

| | |
|---|---|
| 5. | ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යාලතා මහත්මිය |
| 6. | ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා |
| 7. | ගරු මන්ත්‍රී එස්.එම්.දර්ශන දිමුතු කුමාර සුභසිංහ මහතා |

**2023 ජනවාරි මස 26 වන දින පැවති පරිසර සහ මහජන පහසුකම් සංවර්ධන කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්රිනී නිරෝෂා ජීවන්ති ප්රනාන්දු මහත්මිය |
| 2. | ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා |
| 3. | ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා |
| 4. | ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා |
| 5. | ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා |
| 6. | ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා |
| 7. | ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා |

**2023 ජනවාරි මස 17 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 01 | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| 02 | ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා |
| 03 | ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා |
| 04 | ගරු මන්ත්රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා |
| 05 | ගරු මන්ත්‍රී ඩබ්.සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා |
| 06 | ගරු මන්ත්‍රිනී ආර්.පී.නදීකා රණවීර මහත්මිය |
| 07 | ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා |

**2023 ජනවාරි මස 05 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 01 | ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා |
| 02 | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 03 | ගරු මන්ත්රිනී නිරෝෂා ජීවන්ති ප්රනාන්දු මහත්මිය |
| 04 | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 05 | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| 06 | මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| 07 | ගරු මන්ත්රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා |
| 08 | ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා |

**2023 ජනවාරි මස 19 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභාව**

| අ/අ | අ/අ |
|---|---|
| 01 | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 02 | ගරු මන්ත්රිනී නිරෝෂා ජීවන්ති ප්රනාන්දු මහත්මිය |
| 03 | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 04 | ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා |
| 05 | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| 06 | මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| 07 | ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා |
| 08 | ගරු මන්ත්රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා |

03. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් සඳහා 2023 වර්ෂයට නව සිසුන් ඇතුළත් කර ගැනීම පසුගිය දින සිදු වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් ප්‍රජා කමිටුවේ ගරු සභාපතිතුමා ඇතුළු කමිටු සාමාජිකයින් සියළුම දෙනාටමද,නිලධාරීන් සියළුම දෙනාටද ස්තූතිය පුද කරන ලදී.

04. 75 වන නිදහස් දිනයට සමගාමීව වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ හාල්දඩුවන ගිනිගල්පොල, කිරිමැටියාන වැරැල්ලවත්ත, ඉහළ මොහොට්ටිමුල්ල සුසාන භූමි තුල රුක් රෝපණ වැඩසටහන් මරණාධාර සමිති සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් සිදු කිරීමට හැකි වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

05. 2023 වර්ෂයට ප්‍රමාණවත් තරම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි වී නොමැති බැවින් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචියට සති දෙකක කාලයක් ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| තීරණ අංක 05 |
| --- |
| 2023 වර්ෂයට ප්‍රමාණවත් තරම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි වී නොමැති බැවින් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය සඳහා සති දෙකක කාලයක් ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් කල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

06. කම්මල්පත්තුව උප කාර්යාලය මගින් සංවිධානය කල ජංගම සේවාව 2023 ජනවාරි මස 20 වන දින වයික්කාල පරන පාර ප්‍රජා ශාලාවේදී පැවැත්වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

07. 2023 ජනවාරි මස පහත සඳහන් මාර්ග වල වලවල් ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීමට හැකි වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

- ගොඩැල්ල පල්ලිය අසල පාර හා බංගලාවත්ත පාර
- වෙන්නප්පුව -සියඹලාගහ පාර
- මෝරුක්කුලිය -සුනාමිවත්ත පාර
- ලුණුවිල වැව අසල පාර
- කොළින්ජාඩිය -ජෝන් පෝල් විද්‍යාල මාවත
- මැ/කටුකෙන්ද-සුරුවම අසල පාර
- සිරිගම්පල -7/සී පොල අසල මාර්ගයේ ප්‍රෙවිශය
- සිරිගම්පල-සාම ජනපද මිණි පිටිය අසල මාර්ගයේ ප්‍රවේශය
- කොළින්ජාඩිය -ජෝන් පෝල් විද්‍යාල මාවත
- නයිනමඩම-වේලන්කන්නි පල්ලිය පාර

08. දන්කොටුව වෙලඳ සංකීර්ණයේ පවතින අළුත්වැඩියාවන් සහ නඩත්තු කටයුතු සම්බන්ධ ඉදිරිපත් කර ඇති වාර්තාව සලකා බැලීම.

පොළ සම්බන්ධයෙන් සලකා බැලීමේදී කරෝල වීදියේ තිබෙන යකඩ කණු ලුණු බැදී මලකඩ කන බැවින් අඟල් දෙකක් පමණ වට ප්‍රමාණයකින් එය කොන්ක්‍රීට් කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

මේවා කර්මාන්ත කමිටුවට යොමු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඊයේ දිනයේදීද දංකොටුව වෙලඳ මහතුන් දෙපලක් පැමිණි බවත්,ශවුන්ද එහි තිබෙන වක්‍රාකාර කොටස කඩා ඉවත් කරන ලෙසට පවසන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.එය මූලිකවම විය යුතු බව තමන්ද සිතන බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 06<br>මෙම වාර්තාව සලකා බැලූ ගරු මහා සභාව මෙම කටයුතු සඳහා ඇස්තමේන්තු සකස් කර ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට තීරණය කරන ලදී. |

09.කොලඹ විශ්වවිද්‍යාලය මඟින් තොරතුරු රැස්කිරීමේ කටයුත්තක් සිදු කරන බවත්, ඒ සඳහා අප ආයතනය තෝරාගෙන තිබෙන බවත් ඒ සඳහා සෑම පක්ෂයකින්ම මන්ත්‍රීවරුන් දෙදෙනෙකු බැගින් සහභාගී වන ලෙසත් ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

10.අංශ වල ප්‍රගතීන් සහ පසුගිය මස සිදු කල කටයුතු සම්බන්ධයෙන් ඩිජිටල් තිරය ඔස්සේ ගරු මන්ත්‍රීවරුන්ට දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 03.යථා පරිදි කල් දී ඇති යෝජනා

### a. ගරු සභාපතිතුමාගේ යෝජනා

**i.** ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සහතික කිරීම සඳහා ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන කේන්ද්‍ර සවිබල ගැන්වීමේ බහු ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණය සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර බී.ඩබ්.ජේ.බාලසූරිය මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

එම මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව මෙම යෝජනාවේදී වැඩිහිටි නිවාස පිළිබඳව කතා කල බවත්, දුම්මලදෙණිය ප්‍රදේශයේ ළමා නිවාසයක්

තිබෙන බවත්,දරුවන්ට ඉතාමත් අපහසුවෙන් ආහාර ලබාදෙන බවත් ඒ පිළිබඳවද අවධානය යොමු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව ලුණුවිල සංබෝධි නිවාසයදතිබෙන බවත්,එහි විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සිටින බවත්,එයටත් පෙර ලෙස ආහාර ද්‍රව්‍යය නොලැබෙන බවත් එබැවින් එයද සලකා බලන ලෙසත් ඉල්ලා සිටින ලදී. හැකි අවස්ථාවලදී ඒ සඳහා දායකත්වය ලබාදෙන ලෙසට ගරු මන්ත්‍රීවරුන්ගෙන්ද පොදුවේ ඉල්ලා සිටින ලදී.

මොහොට්ටිමුල්ලේ සහන නිවාසයද මෙයට ඇතුළත් කරගන්නා ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්.ඒ .ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

වගා කටයුතු හඳුන්වා දීම සම්බන්ධයෙන් ද කතා කල බවත්, එහිදී බුලත් වගාවට තම ප්‍රදේශයේ ගොවීන් විශාල ලෙස යොමු වී ඇති බවත් එම වගාවන් අතරට බුලත් වගාවද ඇතුළත් කල හැකි බවත් ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.එමෙන්ම කැඳ වැඩසටහනද යෝග්‍ය බවත්,එහිදී මසක් පුරාවට තෝරාගත් එක පෙරපාසලක් යන්න සඳහන් වූ බවත්,නමුත් සෑම පෙර පාසලකටම සතියෙන් සතිය මාරු කර ලබා දෙමුයැයිද යෝජනා කරන ලදී.
මෙහිදී ලබා දෙනුයේ අමුද්‍රව්‍යය දැයි ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විමසා සිටින ලදී. අමුද්‍රව්‍යය ලබා දෙන බව විෂය භාර නිලධාරී මහතා විසින් පවසා සිටින ලදී.

කොළකැඳ වැනි කැඳ වර්ගයක් ලබා දුනහොත් දෙමාපියන්ම එම කොළ වර්ගද සොයා දෙන බවත් එවිට අත්‍යවශ්‍යම දේ පමණක් ලබා දී විශාල ළමුන් පිරිසකට එය ලබා දීමට හැකි වන බවත් ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

බුලත් වැනි දේ ආහාර සුරක්ෂිතභාවයට ඇතුළත් කර ගැනීමට හැකි දැයි ගරු මන්ත්‍රී ඩබ්.ඒ .ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදි.

ආර්ථිකය නඟා සිටුවීමට එමඟින් හැකි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

වී වැනි ද්‍රව්‍යය වගා කර ගබඩා කර ගැනීම මෙහිදි සඳහන් වන බවත්,එනම් ආහාර හිඟයක් පැමිණියහොත් පාරිභෝජනය කිරීමට හැකි දේ වගා කිරීම මෙම යෝජනාව තුළින් ගෙන ආ බවත් විෂයභාර නිලධාරී පහදා දෙන ලදී.

බුලත් වගාවට ආර්ථිකය පසින් වටිනාකමක් ලබා දෙමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

වෙන්නප්පුව බල ප්‍රදේශයේ තිබෙන වැඩිහිටි නිවාස,ළමා නිවාස වැනි දෑ ඉතාමත් අපහසුවෙන් මේ දින වල කරගෙන යන බවත් එබැවින් වර්ගීකරණය නොකොට මෙම බල ප්‍රදේශයේ සියළුම නිවාස වලට

මෙම ආධාර සමසේ බෙදා දෙන ලෙසට ඉල්ලීමක් කරන බවත් ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා ප්‍රකාශ කරන ලදී.

වැව් වලට මාළු පැටවුන් දැමීම සම්බන්ධයෙන් යෝජනාවේ සඳහන් වූ බවත්, වැව් වලට මාළු පැටවුන් දැමා ඉන්පසු පාසි වැවීමෙන් එම මාළු පැටවුන් විනාශ වන බවත්,බොරලැස්සේ එලෙස වැව් දෙකකට මාළු පැටවුන් දමා විනාශ වූ බවත්, එබැවින් ඒ සඳහා විශේෂ වැඩ පිළිවෙලක් සකස් කල යුතු බවත් ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය මෙහිදි පවසා සිටින ලදී.ඒ සඳහා ධීවර සමිතියක් පිහිටුවා කටයුතු කිරීමට සිදු වන බවත් ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධව සවිස්තරව ඉදිරියේදී කතා කරමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

බොරලැස්ස ප්‍රදේශයේ වැවක් තිබෙන බවත්,ඒ අසලින් ගමන් කිරීමට නොහැකි බවත්,ඉතාමත් දුර්ගන්ධයක් පිටවන බවත්,ඒ පිළිබඳව ජනතාවද,මන්ත්‍රීතුමියද තමාට පවසා ඇති බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කර වැව විධිමත්ව පිරිසිදු කරමුයැයි තමන් යෝජනා කරන බවත්,ඉන්පසුව ධිවර සමිතියක් පිහිටුවා එම වැවෙහි මාළු දමා ගැනීමට හැකි ලෙස ස්වයං රැකියාවක් ලෙස හෝ කිරීමට වැඩපිළිවෙලක් සකස් කර දෙන ලෙසත් එය ආදර්ශමත් වැඩක් බවත් ප්‍රකාශ කරන ලදී.

තමන් මිට වසර ගණනාවකට පෙර වෙන්නප්පුව වැව සමග එම කටයුත්ත ආරම්භ කල බවත්, අදටත් එම වැව පිරිසිඳුව තිබෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.එම වැව ගම් මට්ටමින් තබා ගැනීමට කටයුතු කලේ නම් නැවතත් එම වැව් නාස්ති නොවී තිබෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

වැව් ගොවිජන සේවා යටතේ තිබිය යුතු බැවින් ඒවා එම ආයතනයට අයිති බව ඔවුන් පවසන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා පවසා සිටින ලදී.

ඒ සඳහා අවසරයක් ලබා දෙන ලෙසට ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එම අවසරය අද ඊයේ ඉල්ලූ අවසරයක් නොවන බවත්,සමිති වලින් මෙය පවිත්‍ර කර මාළු දමාගෙන නඩත්තු කරගෙන යන බවත්,ජලය අවශ්‍ය කාලයට එමඟින් ගොවින්ට ජලය ලබා දෙන බව පැවසූ නමුත් එවැනි අවසරයක් ගොවිජන සේවා ආයතනය ලබා නොදෙන බවත්, ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ලබන සතියේ කොමසාරිස්තුමා සමඟ සාකච්ඡාවක් කැඳවා ඇති බවත්,ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ජංකුරාවෙල වැව මේ සඳහා යෝග්‍ය බවත්, කුඹුරු පුරන් වී ඇති බැවින් කුඹුරු වැඩද සිදු නොකරන බවත් ගරු මන්ත්‍රී අයි.බී.සැම් හරීශ්නාත් සරත්චන්ද්‍ර මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 07

ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සහතික කිරීම සඳහා ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන කේන්ද්‍ර සවිබල ගැන්වීමේ බහු ආංශික ඒකාබද්ධ යාන්ත්‍රණය සඳහා වූ 2023 වර්ෂික සැලැස්මට ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රමාලතා මහත්මිය විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

ii. 2023 වර්ෂයේ සිදු කිරීමට නියමිත පහත සඳහන් කර්මාන්ත සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

මෙම ලබා දී තිබෙන ලැයිස්තුවේ අංක 04 යටතේ මැක්ෂි හවුස් එක අසල ස්ලැබ් එක දැමීම සම්බන්ධව කාලයක පටන් කතා කරන බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

එය දැමූ බවත්,නමුත් නැවතත් කැඩී ගොස් ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම කර්මාන්ත 43 පමණ තිබෙන බවත් ඒවා කිරීමට මුදල් සභාවේ මුදල් තිබේදැයිද විමසා සිටින ලදී.

2023 වර්ෂයේ මුදල් තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සියළුම දේට එකවර ඇස්තමේන්තු සකස් නොකර ප්‍රධාන කටයුතු සිදු කරන ලෙස ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහි නඩත්තු පාරවල් තිබෙන බවත්,ඒවාට එතරම් මුදලක් නොයන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

අංක 10 යටතේ ප්‍රිමික්ස් අංගණයේ ඉතිරි වැඩ නිම කිරීම තිබෙන බවත්,එයට ඇස්තමේන්තුවක් අනුමත වූ බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

සියල්ලන්ගේම මහා සභා අනුමැතිය එවන ලෙසට කුරුණෑගලින් දැනුම් දී ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඇස්තමේන්තු සකස් කර ඇති කර්මාන්තයන් පලමුව සිදු කරමුයැයි ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.
වැඩ අධිකාරීමහතා නිරීක්ෂණය කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

**තීරණ අංක 08**

ඉහත ඉදිරිපත් කරඇති කර්මාන්ත සිදු කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

01. කිරිමැටියාන මහජන පුස්තකාලයේ වහලය අළුත්වැඩියාව
02. කම්මල්පත්තුව මහජන පුස්තකාලයේ ප්‍රධාන දොර අළුත්වැඩියාව හා බිම
කාර්පට් ඇතිරීම
03. කම්මල්පත්තුව මහජන පුස්තකාලයේ පුවත්පත් කියවීමේ අංශය ඉදිකිරීම
04. මැක්ෂි හවුස් එක අසල ස්ලැබ් කැටයක් දැමීම
05. ලුණුවිල මහජන පුස්තකාලයේ යතුරුපැදි අංගනය ඉදිකිරීම
06. ලුණුවිල මහජන පුස්තකාලයේ පඩි පෙල සඳහා වැසි ආවරණයක් සැකසීම
07. වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ජල ටැංකි ස්ථාපිත කිරීම

08. තෝප්පුව වැසිකිලියෙහි අළුත්වැඩියා කටයුතු සිදු කිරීම
09 යෝගියාන ආදාහනාගාරයේ ළිඳ සකස් කිරීම
10. ප්‍රිමික්ස් අංගනයේ ඉතිරි වැඩ නිම කිරීම
11.බොරලැස්ස කිරාගාර පාර සිරිල් මහතාගේ නිවස අසල පාර
12.බ/කටුකෙන්ද මැදි කැලේ පාර
13. බ/කටුකෙන්ද පන්සල පාර
14.ප/මොහොට්ටිමුල්ල දොස්තරවත්ත අතුරු පාර ගල් තාර දමා ප්‍රතිසංස්කරනය කිරීම
15. සිංගක්කුලිය උදාර ජනපද මාර්ගය 2 අදියර
16. යෝගියාන ධම්මවිජය මාවත
17.රන්දියගම ජනපද මාර්ගය අළුත්වැඩියා කිරීම
18.ජෝන්පෝල් පාසල අසල මාර්ගය
19. මෝරුක්කුලිය සුමගිය ඉදිරිපිට මාර්ගයේ බුළුගහ මාවත
20. උ/දංකොටුව සෙත්සිරි උයන ජය මාවත
21. නැ/දංකොටුව වලව්වත්ත පන්සල පාර
22. බ/දංකොටුව මැදිකැලේ පාර
23. ගොඩැල්ල නුවන් ප්‍රින්ටර්ස් පාර
24.අඹගහ ජනපදයේ ඉතිරි කොටස (උණු තාර මිශ්‍රණය යොදා ) ප්‍රිමික්ස් කිරීම
25.සින්දාත්‍රිය වේලක්කන්නි දේවස්ථානය අසල මාර්ගය
26.ද/කම්මල මැණිකා උළු මෝල එඩ්වඩ් මහතාගේ නිවස අසල මාර්ගය
27.වයික්කාල අනාථ අගල හරහා නාන තොටුපල පාරේ බෝක්කුව ඉදි කිරීම
28.සහනගම ක්‍රීඩාපිටිය නාම පුවරුව සැකසීම
29.පැබ්‍රෝනියා වත්ත (ක්‍රීඩාපිටිය පාර) පිළිසකර කිරීම
30.බ/ලුණුවිල බතලහේන මාර්ගය
31.මැ/ ලුණුවිල 7බි රජයේ කොටසේ හරස් මාර්ගය
32.කිරිමැටියාන පන්සල් හන්දිය බර්නාඩ් වත්ත පාර අළුත්වැඩියා කිරීම
33.බ/කහටවිල බර්නාඩ් වත්ත පාර අළුත්වැඩියා කිරීම
34.තුලාවල හන්දියෙන් පහල පාර
35.බ/හාල්දඩුවන මල්වත්ත පාර
36.ගාලවත්ත ප්‍රධාන මාර්ගයේ කොටසක් අළුත්වැඩියා කිරීම
37. කිරිමැටියාන ප්‍රිමික්ස් අංගනයේ ඉතිරි වැඩ නිම කිරීම
38.නැ/දුම්මලදෙනිය විජය මහතාගේ නිවස පාර
39.බ/දුම්මලදෙනිය තල්දෙක මිනිපිටිය රංජනි මහත්මියගේ නිවස අසල පාර
40.ගලයාය කොලනිය අතුරු පාර
41. කිරිමැටියාන මහජන පුස්තකාලය සඳහා අළුතින් කොටසක් ඉදිකිරීම.
42. කිරිමැටියාන පුස්තකාලයෙහි කොටසක් ඉදි කිරීම
43.නෙළුම් පෙදෙස පාර නවීකරණය කිරීම
44. දුමුන්නාගාර පාර පහල බුජ්ජම්පල-ලිහිරියාගම
45. ශා.ආනාපුර පල්ලිය ඉදිරිපිට මාර්ගය - මැද ලුණුවිල

**iii.** සේවා ගිවිසුම් කාලය අවසන් වන සේවකයින් 22 දෙනෙකුගේ සේවා ගිවිසුම් කාලය මාස 06කින් දීර්ඝ කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව සේවා කාලය කෙතරම් දීර්ඝ කලද වැඩක් කරගැනීමට ගිය විට කිසිවෙකු නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.දෙන බවට පැවසුවද කිසිදින සේවකයෙකු වැඩ කටයුතු වලට ලබානොදෙන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 09

සේවා ගිවිසුම් කාලය අවසන් වන පහත සඳහන් සේවකයින් 22 දෙනෙකුගේ සේවා ගිවිසුම් කාලය මාස 06කින් දීර්ඝ කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

| අ/අ | නම | තනතුර | ගිවිසුම් කාලය දීර්ඝ කර ගත යුතු කාලය |
|---|---|---|---|
| 01 | ආර්.කුමාර් රගුවන් මයා | සෞඛ්‍ය කම්කරු | 2023.02.25 සිට 2023.08.24 |
| 02 | ආර්.කමන් කුෂාන්ත මයා | සෞඛ්‍ය කම්කරු | 2023.02.25 සිට 2023.08.24 |
| 03 | ඩබ්.අමිත් මධුසංක පීරිස් මයා | වැඩ කම්කරු | 2023.03.26 සිට 2023.09.25 |
| 04 | ඩබ්.කේ.එම්.එම්.කාංචනා මධුභාෂිනී මෙය | වැඩ කම්කරු | 2023.03.04සිට 2023.09.03 |
| 05 | ඒ.එ්.විනෝද් මදුරංග සිල්වා මයා | වැඩ කම්කරු | 2023.03.06 සිට 2023.09.05 |
| 06 | එස්.ඒ.බී.එස්.නිරෝෂන් අප්පුහාමි මයා | වැඩ කම්කරු | 2023.03.06 සිට 2023.09.05 |
| 07 | ඒ.පී.උමේෂ් නිසල් සංකල්ප මයා | වැඩ කම්කරු | 2023.03.06 සිට 2023.09.05 |
| 08 | අයි.ප්‍රසාද් සංජීව සජිත් මයා | සෞඛ්‍ය කම්කරු | 2023.03.26 සිට 2023.09.25 |
| 09 | ආර්.ඒ.ගීත් නිර්මාල් මයා | සෞඛ්‍ය කම්කරු | 2023.03.26 සිට 2023.09.25 |
| 10 | කේ.ආර්.සුනිල් පෙරේරා මයා | සෞඛ්‍ය කම්කරු | 2023.03.26 සිට 2023.09.25 |
| 11 | ටී.එම්.ඩී.සුදම් පසිඳු පීරිස් මයා | සෞඛ්‍ය කම්කරු | 2023.03.26 සිට 2023.09.25 |
| 12 | ආර්.කේ.දිනේෂ් මයා | සෞඛ්‍ය කම්කරු | 2023.03.26 සිට 2023.09.25 |
| 13 | ඩී.එම්.වසන්ත දිසානායක මයා | සෞඛ්‍ය කම්කරු | 2023.03.26 සිට 2023.09.25 |
| 14 | පී.ඒ.අයේෂා මදුවන්ති පෙරේරා මිය | සෞඛ්‍ය කම්කරු | 2023.03.26 සිට 2023.09.25 |
| 15 | සමිත් ධනංජය ප්‍රනාන්දු මයා | සෞඛ්‍ය කම්කරු | 2023.03.26 සිට 2023.09.25 |
| 16 | ජේ.ඒ.මිලාන් සන්දීප මයා | වැඩ කම්කරු | 2023.03.26 සිට 2023.09.25 |
| 17 | එස්.පී.රුවන් ක්‍රිශාන්ත මයා | රියදුරු | 2023.03.26 සිට 2023.09.25 |
| 18 | ඒ.පී.පී.දර්ශන ජයලාල් මයා | රියදුරු | 2023.03.28 සිට |

| | | | |
|---|---|---|---|
| | | | 2023.09.27 |
| 19 | ඩී.ඒ සනත් ඉන්දික මයා | රියදුරු | 2023.03.28 සිට 2023.09.27 |
| 20 | ආර්.එස්. දුෂ්ෂන්ත ප්‍රනාන්දු මයා | රියදුරු | 2023.03.28 සිට 2023.09.27 |
| 21 | ජේ.ඒ.සංජීව පද්මසිරි මයා | රියදුරු | 2023.03.28 සිට 2023.09.27 |
| 22 | බී.කේ.තුෂාන් මංජුල මයා | රියදුරු | 2023.03.28 සිට 2023.09.27 |

**iv.** සභා අරමුදලින් කරනු ලබන ගෙවීම් සඳහා චෙක්පත් අත්සන් කිරීමේ බලය පැවරීමට අදාලව පහත පරිදි අනුමැතිය ලබා දීම සුදුසු බවට බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

- පළමු අත්සන - ඩබ්.ඩී.ලූෂන් මහතා-ලේකම්
- දෙවන අත්සන-1. එච්.පී.සමන්ත කුමාර- ප්‍රධාන කලමනාකරණ සේවා නිලධාරී
  2. එම්.ආර්.කුරුකුලසූරිය -කලමනාකරණ සේවා නිලධාරී

තීරණ අංක 10

සභා අරමුදලින් කරනු ලබන ගෙවීම් සඳහා චෙක්පත් අත්සන් කිරීමේ බලය පැවරීමට අදාලව පහත පරිදි අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

- පළමු අත්සන - ඩබ්.ඩී.ලූෂන් මහතා-ලේකම්
- දෙවන අත්සන-1. එච්.පී.සමන්ත කුමාර- ප්‍රධාන කලමනාකරණ සේවා නිලධාරී
  2. එම්.ආර්.කුරුකුලසූරිය -කලමනාකරණ සේවා නිලධාරී

v. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පණත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නීතිරීති යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා කාර්යය කටයුතු අවශ්‍ය අවස්ථා වලදී සභාවට අගතියක් නොවන පරිදි සභාපතිතුමාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩබ්.ඩී.ලූෂන් මයා වෙත බලතල පැවරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව මෙම කටයුතු දැනටමත් සිදු කරගෙන යන බවත්,නමුත් අධිකරණයට හෝ යාමට සිදු වුවහොත් බලය පැවරීමක් අවශ්‍ය බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 11

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පණත යටතේ හෝ ඒ යටතේ සාදන ලද නීතිරීති යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා කාර්යය කටයුතු අවශ්‍ය අවස්ථා වලදී සභාවට අගතියක් නොවන පරිදි සභාපතිතුමාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩබ්.ඩී.ලූෂන් මයා වෙත බලතල පැවරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

## 04 . කාරක සභා වාර්තා සලකා බැලීම.

**i.** 2023-01-12 හා 2023-01-24 වන දින වල පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා සලකා බැලීම

2023-01-24 වන දින කමිටු වාර්තාවේ **"සභාවට අයත් RV-0583, RX-2447, 67-1172, RV-4089 අංක දරණ ට්‍රේලර් 4ක අළුත්වැඩියාවක් තිබෙන බවට සාකච්ඡා කරන ලදී.**

**එහිදී එම අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා කමිටුවේ අනුමැතිය ලබා දුන් අතර එම ට්‍රේලර් වල අඩිය සහ වට කොටස ඇළුමිනියම් වලින් සකස් කිරීමටත් කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදී. "** ලෙස සඳහන් වී ඇති බවත්, එහිදී ඇස්තමේන්තු සකස් කිරීමේදී යකඩ තහඩු වෙනුවට ඇළුමිනියම් තහඩු දමන ලෙසට දැනුම් දුන් බවත් එය ක්‍රියාත්මක වී තිබේදැයි ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

එය එලෙස සකස් කර ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා බස් වලට යොදා ගන්නා තහඩු දැම්මේ නම් පැවැත්මක් තිබෙන බව ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

එම තහඩුවේ ඝණකම කෙසේදැයිද ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

එය කමිටුවට ඉදිරිපත් කරන බවත්,මෙම කාර්යය හොඳ බව ඉංජිනේරු මහතා පෞද්ගලිකව තමන්ට පැවසූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 12

2023-01-12 හා 2023-01-24 වන දින වල පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මියගේ හා ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

**ii.** 2023-01-05 හා 2023-01-19 වන දින වල පැවති මාර්ග,ඉඩම්,ගොඩනැගිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තා සලකා බැලීම

කර්මාන්ත සහ ඉඩම් සම්බන්ධව මෙම කමිටුවට තිබෙන බවත්,එබැවින් ඉඩම් කට්ටි කිරීමේදී කර්මාන්ත කමිටුවේද අනුමැතිය ගැනීමට තීරණය කල බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී. ඉතාමත් විශ්වාසවන්ත කරුණක් තමන්ට දැන ගැනීමට ලැබුණු බවත් ඉඩම් කට්ටි කිරීමේදී සභාවේ තිබෙන ලිපි ලේඛණ වල අනුමැතිය නොමැති බවත්, නමුත් ඉඩම් කට්ටිකරන පුද්ගලයාගේ අතේ අනුමැතිය තිබෙන බවත් මේ සම්බන්ධයෙන් සොයා බලන ලෙසට ද නැතිනම් උසාවි යාමට සිදු වන බවත් ප්‍රකාශ කරන ලදී.එය කමිටුවට පැමිණ නොමැති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඉඩම් සම්බන්ධ නිලධාරීයාවද කමිටුවට සහභාගි කරවන ලෙස ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ඉඩම් කොපමණ ප්‍රමාණයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයිතිය ඉල්ලා ඉදිරිපත් කර තිබේදැයිද ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී.

එම කමිටුව සඳහා ඉංජිනේරු ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් මහතාව පත්කර ඇති බවත්,එතුමාව එයට කැඳවන ලෙසත් ගරු මන්ත්‍රි ඩබ්ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව සභාවේ ඉඩම් පවරා ගැනීම සම්බන්ධයෙන් විමසීමක් කල බවත්,පසුගිය සතියේ දන්කොටුව ඉඩම් බැලීමට ගිය බවත්,මේ සඳහා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාද සම්බන්ධ වූ බවත් බොහෝ ඉඩම් පවරා දීමට සූදානම් කිරීම ආරම්භ කිරීම පමණක් සිදු කර ඇති බවත් දැනටත් සුසාන භූමි දෙකකට පමණක් පැවරුම් නියෝග ගත හැකි බවත් ප්‍රකාශ කරන ලදී.යම් ඒවාට මැනුම් නියෝග ඉදිරිපත් කර ඇති නමුත් මැනුම් කටයුතු සිදු කර නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. ඊළඟ සතියේ වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යාමට තමන් සූදානමින් සිටින බවත්,දංකොටුව ප්‍රදේශයේ වාර්තාව ඊළඟ මහා සභාවට ඉදිරිපත් කිරීමට හැකිවේවියැයිද ප්‍රකාශ කරන ලදී.

ඉඩම් කොටස් කිරීම පිළිබඳවද කතා කල බවත්,අපේ ඉඩම් කොටස් කිරීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරි පණතෙන් බලය පැවරී ඇති බවත්,දන්කොටුව හා වෙන්නප්පුව යන ප්‍රදේශ දෙකට මෙය ක්‍රියාත්මක වන බවත් මේ සඳහා නිලධාරීන් ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වී අනුමැතිය ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදී.ඊට අමතර පලාත් සභාවේ අතුරු ව්‍යවස්ථාව අනුව අනෙක් ඉඩම් කොටස් කිරීමට කමිටුවක් සිටින බවත් එයටද පරිසර නිලධාරී, කාර්මික නිලධාරී ඇතුළු කමිටුවක් මඟින් අනුමැතිය ලබාදෙන බවත් ප්‍රකාශ කරන ලදී.සභාවේ තොරතුරු නොමැතිව ඉඩම් කොටස් කරන පුද්ගලයෙකු සතුව අනුමැතිය තිබෙන බවට ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කල බවත්,ඒ සඳහා පරීක්ෂණයක් කිරීමට තොරතුරු ලබාදෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.

මෙම කමිටුවට කරමාන්ත කමිටුව නියෝජනය කරමින් ඉංජිනේරු ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් මහතාව නම් කිරීමට තීරණයක් ගත් බව ගරු මන්ත්‍රි ඩබ්ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

එතුමා සෑම විටම වැඩ කටයුතු වල නියැලෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ නියෝජිතයෙකු ලෙස පත් කරන්නේ නම් කමිටුවට කැඳවීමක් කිරීමට හැකි බව ලේකම් මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව කොන්දේසි ලිපියක් සකස් කර ඒ අනුව වැඩ කටයුතු ආරම්භ කරන බවත්,ටික කාලයක් යන විට ඉඩම්

කොටස් විකිණීමට ආරම්භ කරන බවත් නමුත් කොන්දේසි ක්‍රියාත්මක නොවන බවත් එබැවින් මේ සම්බන්ධයෙන් පසුවිපරමක් තබා ගැනීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.අදාල තාක්ෂණ නිලධාරියා ද ඒ සම්බන්ධව එකතු වී එම කටයුතු බැලිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

අවසානයේදී අනුමැතිය දෙනුයේ ඒ සියල්ල සොයා බලා බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තම කොට්ඨාස වල ඒ සඳහා උදාහරණ ඇති බවත්, එය සොයා බැලිය යුතු බවත් බුජ්ජම්පල හා බ/කහටවිලද එවැනි ඉඩම් කට්ටි කල ස්ථාන තිබෙන බවත්,සභාවක් ලෙස අවසානය වන තෙක් ඒවා විසඳා දෙන්නේ නම් හොඳ බවත් ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය යෝජනා කරන ලදී.

වසර 10ට පෙර කටුකෙන්ද ප්‍රදේශයේ ඉඩමක් කට්ටි කල බවත්,මෑතකද එය නැවත කට්ටි කල බවත් සභාවට කොටසක් නොදී එසේ කිරීමට හැකි දැයි ගරු මන්ත්‍රී වී.ඒ.වර්ණ රංග ගුණසේකර මහතා විමසා සිටින ලදී.

මෙහිදී පැමිණිල්ලක් තිබේනම් ලේකම් මහතාට ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර වැඩ අධිකාරී මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

වැඩ අධිකාරී මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව අතුරු ව්‍යාවස්ථාව අනුව හෙක්ටයාර 1කට වැඩි ඉඩමක් කොටස් දෙකකට හෝ කීපයකට බෙදා වසර 10ක් ගත වූ පසුව නැවත බෙදුව හොත් සභාවට පොදු කොටසක් ගැනීමට නොහැකි වන බවත්, නාගරික සංවර්ධන බල ප්‍රදේශයේ ඊට වෙනස් බවත් ප්‍රකාශ කරන ලදී.

ඉඩම් කොටස් කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් විසින් තොරතුරු විමසමින් දැනුවත් වන ලදී.

මහා සභාවට මින් පෙර ඉදිරිපත් වූ ඉඩම් කට්ටි කරන ගැටළුවට කුමක් සිදු වූයේදැයි ද ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී.

එය කොමසාරිස්තුමාට වාර්තා කල පසුව නැවත නොමැපැමිණි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

2018/2019 හා 2020 වර්ෂ වල වෙන්නප්පුව බල ප්‍රදේශයේ ඉඩම් කට්ටිකල තොරතුරු ලබා දුන් බවත් ඒ අනුව සභාවට ලැබෙන කොටස් වල ඔප්පු තිබේදැයිද ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විසින් විෂයභාර නිලධාරීගෙන් විමසූ අතර සියල්ලේම ඔප්පු තිබෙන බව එම නිලධාරී මහතා විසින් පවසා සිටින ලදී.

ගැටළු තිබෙන බවත්,මැදිකැලේ ගැටළුවේදී ඔප්පුවක් නොමැති බවත් ,උගත් නීතිඥමහතුන් එය සභාවට අයත් නොවන බවට තර්ක ගෙන එන බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

ඊළඟ මහා සභාවට තොරතුරු ලබාදෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඉඩමක් කොටස් කරන විට එම පුද්ගලයා සංවර්ධනය කර විකුණන බවට බැනර් එකක් දමන බවත්,එම බැනර් එක ප්‍රදර්ශනය කිරීමට නම් අදාල තොරතුරු සභාවට ඉදිරිපත් කර අනුමැතියක් ගත යුතුදැයි ගරු මන්ත්‍රී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය විසින් විමසා සිටින ලදී.

එසේ සිදු කල හැක්කේ සභාවේ අනුමැතිය ලබා දුන් පසුව බව වැඩ අධිකාරීමහතා විසින් පවසා සිටින ලදී.

ඒ සම්බන්ධයෙන් අදාල නිලධාරී චන්දිමාල් මහතාගෙන්ද විමසීමක් කල බවත් නමුත් පැහැදිලි පිළිතුරක් නොලැබුණ බවත් මේ වන විට පොතුවටවන ඉඩම් කොටසක් එලෙස සිදු කර ඇති බවත් ඒ සඳහා සභාවට ලිපි යොමු වී අනුමැතිය ලබා දී ඇත්දැයි දැන ගැනීමට කැමති බවත් යුතුදැයි ගරු මන්ත්‍රී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

එය සොයා බලා පවසන බව වැඩ අධිකාරී මහතා පවසා සිටින ලදී.

තීරණ අංක 13

2023-01-05 හා 2023-01-19 වන දින වල පැවති මාර්ග,ඉඩම්,ගොඩනැගිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු උප සභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

**iii.** 2023-01-20 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කළමනාකරණ කාරක සභා වාර්තාව සලකා බැලීම

තීරණ අංක 14

2023-01-20 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කළමනාකරණ කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතාගේ හා ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

**iv.** 2023-01-17 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීම

තීරණ අංක 15

2023-01-17 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතාගේ හා ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

**v.** 2023-01-26 වන දින පැවති පරිසර හා මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීම

තීරණ අංක 16

2023-01-26 වන දින පැවති පරිසර හා මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

**05.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම.**

**i. මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය -2022 දෙසැම්බර්**

**ii. මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය -2022 දෙසැම්බර්**

ප්‍රාග්ධන ආදායම පිළිබඳව ගැටළුවක් තිබෙන බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.මුදල් පැමිණෙන බව පැවසුවද පැමිණ නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

කොම්පෝස්ට් අංගණයේ සියළුම මුදල් පැමිණි බවත්,මාර්ග සඳහාද කොටියක මුදල් පැමිණි බවත් එම මුදල් ජනවාරි මාසයේදී ලැබී ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 17

2022 දෙසැම්බර් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම් කිත්සිරි අභයවික්‍රම මහතා යෝජනා කල අතර ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

iii. 2023 ජනවාරි මස ඉන්ධන හා අළුත්වැඩියා වෙනුවෙන් වියදම් වූ වාර්තාව සලකා බලන ලදී.

iv. 2023 ජනවාරි මස වීථි පහන් නඩත්තු කිරීම පිළිබඳ ප්‍රගති වාර්තාව සලකා බලන ලදී.

v. 2022-12-31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සලකා බැලීම

භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විශාල බවත්,එබැවින් එක් වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන බවත් ගැටළුවක් තිබේ නම් සාකච්ඡා කරමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණයේ බට නොමැති බවට සඳහන් වී ඇති බවත්,මින් පෙරද යකඩ බට නැති වී තිබූ බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

එම බට 19 බුජ්ජම්පල පන්සලට ගෙන ගොස් තිබූ බවත්,ඊට අදාල ලිපිය ලැබී තිබූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් මෙම වාර්තාව අනුමත කිරීමට නොහැකි බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර විෂයභාර නිලධාරී මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

එම මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව වාර්තාවේ පිටු පන්සියක් පමණ තිබෙන බවත්,එබැවින් කෙටියෙන් සඳහන් කර වාර්තාවක් ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කල බවත් පවසා සිටින ලදී.

කෙසේ නමුත් එම අදාල ද්‍රව්‍යය නොමැති බවට මෙහි සඳහන් වී තිබෙන බවත්,එම අඩුව පෙන්වා දෙන ලෙසත්,අද දින සභාවේ මෙය අනුමත කල නොහැකි බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය සභාවේ අනුමත විය යුතු බවත්,ඉන් පසුව නැවත කමිටුවක් මඟින් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට යවන බවත් විෂයභාර නිලධාරී විසින් පවසා සිටින ලදී.

මෙම ඉදිරිපත් කර තිබෙන ලිපියේ අත්සන් කර නොමැති බවත්,එබැවින් මෙය අනුමත කල නොහැකි බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා සහ ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විසින් පවසා සිටින ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව කාර්යාලයෙන් කාර්යාලට සමීක්ෂණ මණ්ඩලයක් පත් කරන බවත්,එම එකින් එකට අදාල වාර්තාව මෙහි තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

සම්පිණ්ඩන වාර්තාවක් මහා සභාවට ඉදිරිපත් කිරීමේදී අත්සන් කර එවිය යුතු බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා පවසා සිටින ලදී.

මෙවැනි කඩදාසියක් ඉදිරිපත් කල නොහැකි බවත්,සම්පූර්ණ වාර්තාව ඉදිරිපත් කල යුතු බවත්, සභාගත කිරීමට නොහැකි බවත්, නමුත් මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම පිණිස එය ඉදිරිපත් කල බවත් ලේකම් මහතා පවසා සිටින ලදී.

මෙහිදී ලිපිගොණුවකින් උපුටා ගන්නා උද්ධෘතයක් ලෙසට අත්සන් කර ඉදිරිපත් කල නොහැකි දැයි ගරු මන්ත්‍රීනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය විමසා සිටින ලදී.

හරි ක්‍රමයට වාර්තාවම ලබා දිය යුතු බවත්,නමුත් විශාල පිරිවැයක් දැරීමට සිදු වන බැවින් මෙලෙස වාර්තාවක් සාදන ලෙසට තමන් උපදෙස් ලබා දුන් බවත් ලේකම් මහතා විසින් පවසා සිටින ලදී.ජනවාරි මාසය අවසානයේදී සියළුම වාර්තා ලැබුණ බවත්,ඉන් අනතුරුව මෙය සකස් කල බවත් තවදුරටත් පවසා සිටින ලදී.උදාහරණයක් ලෙස ප්‍රධාන කාර්යාලයට සමීක්ෂණ මණ්ඩලයක් පත් කල බවත් එම මණ්ඩලය මඟින් බඩු නැති වී ඇති බවට වාර්තාවේ සඳහන් කර නොමැති බවත් එලෙස මණ්ඩල පත් කල බවත් ප්‍රකාශ කරන ලදී.ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණයේ බට 19ක් සමීක්ෂණය කිරීමට ගිය මොහොතේදී අඩු වී ඇති බවත් එය වාර්තා කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.සභාවට දැන ගැනීම පිණිස මෙලෙස වාර්තාවක සඳහන් කර එවූ බවත් ප්‍රකාශ කරන ලදී.මෙම නැති වී ඇති බඩු වලට එම ස්ථානය භාරව සිටින පුද්ගලයින් වගකිවයුතු බවත් එහිදී නිර්දේශ ක්‍රියාත්මක කිරීමට යන අවස්ථාවේදී ඒවා නොතිබුනහොත් අයකර ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

ස්ථානභාර නිළධාරියාට මෙම භාණ්ඩ පොත්පත්වල සටහන් නොකර අදාල ස්ථානයෙන් පිට කිරීමට හැකියාවක් තිබේදැයිද ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

තමන් අසල පන්සලෙන් ලබා දී තිබූ ලිපිය තිබෙන බවත්,එය ගෙන ගොස් නොමැති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

බට පන්සලේ තිබී හරියන්නේ නොමැති බවත්,භාණ්ඩ සමීක්ෂණය කරන අවස්ථාවේදී අදාල බඩු/උපකරණ තිබිය යුතු බවත්,එසේත් නොමැති නම් නිලධාරීන්ට පෙන්වීමට පන්සලෙන් ලබා දී තිබූ ලිපිය තිබිය යුතු බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා පවසා සිටින ලදී.

සෝෂාව.....

බට නොමැති වුවහොත් අය කිරීම සිදු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඉන්පසුව කෙහෙන් හෝ බට ගෙනැවිත් පෙන්වා නැවතත් ගොස් දැමුවහොත් භාණ්ඩ සමීක්ෂණ කර ඵලක් නොවන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

එවා නිවැරදිව නොතිබුණහොත් අය කිරීමක් සිදු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මහා සභාව උත්තරීතර ස්ථානයක් බවත්,එබැවින් ඒ සඳහා යොමු කරන ලිපි වලට අත්සන් කර එවිය යුතු බවත්,නැතිනම් පිළිගැනීමට නොහැකි බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

භාණ්ඩ සමීක්ෂණ නිලධාරීන්ට ගෙවීමක් සිදු කරන බවත්,ලිපි ගොණුවක් තිබෙනවා මෙම ලිපිය දැන ගැනීමට එවූ බවට පැවසීම වැරදි බවත්,මෙය පිළියල කලේ සකස් කලේ යන්න තිබිය යුතු බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ප්‍රකාශ කරන ලදී. මෙය ගරු සභාපතිතුමාද අපහසුතාවයට පත් වන කාරණාවක් බවත් ප්‍රකාශ කරන ලදී. ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණයේ ලිපියක් නොමැතිව බට පිටතට යැවූ බවට පවසා මෙම සභාවෙන් මෙය අනුමත කරගත් පසුව මෙය අනවශ්‍ය ගැටළුවක් බවට පත් වන බවත් මෙය අනවශ්‍ය ප්‍රකාශයක් බවත් ආගමික හා සමාජීය ගැටළුවක් බවත් පවසා සිටින ලදී.

මෙහි පවතින හිඟයන් අය කරන බවත්,අත්සන් නොකිරීම අතපසුවීමක් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඉදිරිපත් කර තිබෙන වාර්තාවේ අංක 03 යටතේ ට්‍රැක්ටර් රථ තුනක් විකිණීමට නිර්දේශ කර ඇති බවත්,ඒවා විකුණන්නේ මන්දැයිද ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.25 C ට්‍රැක්ටරයක් තමන් සතුව තිබෙන බවත්,එය තවමත් හොඳින් වැඩ කරන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

එම ට්‍රැක්ටර් අළුත්වැඩියාවට අවශ්‍ය උපකරණ නොමැති බවට ඉංජිනේරු මහතුන් පවසන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් ඉංජිනේරු වාර්තාවක් ගෙන මහා සභාවට යොමු කරන ලෙසට ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා පවසා සිටින ලදී.මේවා සාදා පාවිච්චියට ගනිමුයැයිද අද වන විට මිල දී ගැනීමට විශාල මුදලක් වැය වන බවත් පවසා සිටින ලදී

එම ට්‍රැක්ටර් නිරීක්ෂණයට යන විට මිකැනික් කෙනෙකු ගියේදැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

සෝෂාව......

මේවා මෙසේ සිදු කල නොහැකි බවත්,ඉංජිනේරු වාර්තාවක් මේ සඳහා කැඳවිය යුතු බවත්,එම වාර්තාවක් ගත්තද තමන් ඒ සඳහාද විරුද්ධ බවත්,මේවා සාදා භාවිතයට ගතහැකි බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා පවසා සිටින ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව ඉදිරිපත් වූ වාර්තාව සම්බන්ධයෙන් කතා කිරීමේදී සෑම වර්ෂයකම සමීක්ෂණ වාර්තා සම්මත වූයේ කඩදාසි ලබා නොදී බවත්,එබැවින් මෙමම වර්ෂයෙදී මෙලෙස වාර්තාවක් ලබාදෙන ලෙසට තමන් පැවසූයේ කඩදාසි සියල්ලම පිටපත් ගසා ලබා දිය නොහැකි නිසා බවත් ප්‍රකාශ කරන ලදී.

වාර්තා ඉදිරිපත් නොකර භාණ්ඩ සමීක්ෂණ වාර්තා වලට අනුමැතිය ගත් බවට පවසන්නේ නම් සභාව නොමඟ යැවීමක් බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අත්සන් කර තිබේදැයි ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.එසේ නම් එම නම් පවසන ලෙසත් ඉල්ලා සිටින ලදී.

මෙහිදී එම අත්සන් කල නම් විෂයභාර නිලධාරී මහතා විසින් පවසා සිටින ලදී.

එසේ නම් මෙම ඉදිරිපත් කර තිබෙන වාර්තාවටද අත්සන් කර එවන ලෙසට ගරු මන්ත්‍රීවරුන් විසින් පවසා සිටින ලදී.

සභාවේ බහුතර තීන්දුව නිලධාරියෙකු විසින් පිළි නොගන්නේ නම් එය සභාගත නොකරන ලෙසට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

භාණ්ඩ සමීක්ෂණ ක්‍රියාවලියට එක් මණ්ඩලයක් පත් කර නොහැකි බවත්,එක් එක් ආයතන එක් එක් මණ්ඩල විසින් සිදු කරන බවත් ලේකම් මහතා ප්‍රකාශ කරන ලදී.මෙහිදී එම එක් එක් ආතයතන වල නැති වූ භාණ්ඩ පිළිබඳව සභාව දැනුවත් කිරීම වැදගත් බවත්,එබැවින් මෙවැනි වාර්තාවක් සභවට යොමු කල බවත්,එම භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් නැති වී ඇති බවට වාර්තාවේ සඳහන් කර ඇති බවත්,සභාපතිතුමා කල ප්‍රකාශය වලංගු නොාවන බවත් ,ඉන්පසුව නැති වූ භාණ්ඩ සඳහා අදාල නිලධරීයා නිදහසට කරුණු ඉදිරිපත් කර නැවත එය සභාවට ඉදිරිපත් කර ඉදිරියට යාමට හැකි බවත් නමුත් එම භාණ්ඩ නැති වූ බවට වාර්තාවේ සඳහන් වන බවත් එය වෙනස් නොවන බවත් ප්‍රකාශ කරන ලදී.ඒ සඳහා අයකර ගැනීමට නිර්දේශ ක්‍රියාත්මක වන බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම භාවිතයට ගත නොහැකි දේවල් විකිණීමට ඉදිරිපත් කර ඇති බවත්,විශේෂයෙන්ම ට්‍රැක්ටර් රථ 4ක් සඳහන් වී ඇති බවත්,මෙහි එකක් දැනට ක්‍රියාත්මක කිරීමට යාන්ත්‍රික ඉංජිනේරු අනුමැතිය ගෙන ඇති බවත් ,වාහන වැනි දේ ඉවත් කිරීමේදී භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය පලමු නිර්දේශය වන බවත්, ඊළඟට පලාත් පාලන කොමසාරිස්තුමා විසින් ඒ සඳහා ගණකාධිකාරී,යාන්ත්‍රික ඉංජිනේරු ,මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු සමඟ සමීක්ෂණ මණ්ඩලයක් පත් කරන බවත් එම මණ්ඩලය බලා ඊළඟ තීන්දුව ලබාදෙන බවත් එයද කොමසාරිස්තුමා අනුමත කර නැවතත් තක්සේරුවක් ගත යුතු බවත් එබැවින් කොමසාරිස්තුමා විසින් නැවතත් තක්සේරු මණ්ඩලයක් පත් කරන බවත් මේ සඳහා පියවර ගණනාවක් තිබෙන බවත් ,අරම්භක පියවර මෙමඟින් ඉදිරිපත් කර ඇති බවත්,අනෙක් වාර්තාද මහා සභාවට ඉදිරිපත් කල යුතු බවත් ප්‍රකාශ කරන ලදි.අනෙක් භාණ්ඩ සඳහා සභාවෙන් අනුමත කර ඉවත් කිරීම් සිදු කල හැකි බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.මේ සියල්ල සිදු වි වාර්තා පැමිණියද සභාවට මේ සියල්ල තබා ගැනීමට ,අළුත්වැඩියා කිරීමට සභාවට බලය තිබෙන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.මෙතෙක් භාණ්ඩ සමීක්ෂණ වාර්තා සභාගත කල බවත්,එය ප්‍රායෝගිකව කිරීමට නොහැකි බැවින් සංෂිප්ත වාර්තාවක් ඉදිරිපත් කල බවත් නමුත් මෙය අත්සන් කර ඉල්ලන්නේ නම් නැවත අත්සන් කර ලබා දිය හැකි බවත් පවසා සිටින ලදී.

තමන්ද භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල ගණනාවක සභාපති වී සිට ඇති බවත්,කිසි දිනක යාන්ත්‍රික උපකරණ වලට එලෙස තීරණයක් ලබා දීමට නොහැකි බවත්,විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදාව පොලීසිය වැනි ආයතන වල මේවා මෙලෙස සිදු කරනුයේ එම භාණ්ඩ පිටතට ලබා දීමට බවත් ඒවා සඳහා යාන්ත්‍රික ඉංජිනේරුවරුන්ද සම්බන්ධ වන බවත් ගරු මන්ත්‍රීඑම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.මෙම ට්‍රැක්ටර් රථ වල කෑබලි යාන්ත්‍රික ඉංජිනේරුවරුන් පැමිණීමට පෙර ඉවත් කල හැකි බවත්,අපගේ රියදුරන් අපගේ සේවකයින් මෙහි සිටින බවත් නමුත් යාන්ත්‍රික ඉංජිනේරුවන් නිර්දේශ කර වෙන්දේසි කල පසුව නැවත ඉවත් කල උපාංගද දමාගෙන රැගෙන යන බවත් ප්‍රකාශ කරන ලදී.මෙය ප්‍රායෝගික දෙයක් බවත්,කැඩුන බිඳුන උපකරණ නිලධාරීන්ට ගොස් නිරීක්ෂණය කිරීමට හැකි බවත් ට්‍රැක්ටර් 4 සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසත්,මෙම ට්‍රැක්ටර් රථ තුනක කෑබලි සවි කර එක් රථයක් හෝ සකස් කර ගැනීමට හැකි නම් වටිනා බවත්, ට්‍රැක්ටර් රථ වල අවශ්‍යතාවයක්ද සභාවට තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.මන්ත්‍රීවරුන්ද මෙම ට්‍රැක්ටර් රථ දැක නොමැති බවත්,මිල දී ගන්නාවාට වඩා වියදම් නැවත සකස් කිරීමට යන්නේ නම් සාදා එලක් නොවන බවත් නමුත් මෙම ට්‍රැක්ටර් රථ පිළිබඳව වාර්තාවක් ගැනීමෙන් අනතුරුව එය බලා ගැනීමට සිදු වන බවත් ප්‍රකාශ කරන ලදී.

තමන්ද මෙම ට්‍රැක්ටර් රථ නිරීක්ෂණයට ගිය බවත්,ඒවා ඇල්බට් ඇෆ් පිරිස් ක්‍රීඩාංගණයේ වාහන අංගණයේ තිබෙන බවත්,එහි හොනට් වර්ගයේ ට්‍රැක්ටර් රථ දෙකක් සහ සමෙය වර්ගයේ ට්‍රැක්ටර් රථදෙකක් තිබෙන

බවත් ඒවා වර්ග දෙකටම අමතර කොටස් නැති ගැටළුව තිබෙන බවත්,තමන් ගැරේජ් වලටද කතා කර විමසූ බවත් ලේකම මහතා පවසා සිටින ලදී.ඉංජිනේරු මහතා සමඟද කතා කල බවත් පවසා සිටින ලදී.

සෝෂාව.....

යකඩ වලට විකිණීමට තිබූ මෝටර් ග්‍රේඩරය අද වන විට වෙනත් සභාවක් විසින් භාවිතා කරන බවත්,එය ප්‍රායෝගිකව ඔප්පු වූ කරුණක් බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් පවසා සිටින ලදී.

මෙම ක්‍රමවේදය ගොස් එන්නම වසර දෙකක් පමණ යන බවත්,එම යාන්ත්‍රණය තමන් දන්නා බවත්,එවිට වාහන දිරාපත් වී යන බවත් එබැවින් මෙය කෙසේ හෝ සාදමුයැයි ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා පවසා සිටින ලදී.

පසුගිය මහා සභාවේ ප්‍රගතිය ලේකම් මහතා විසින් ඉදිරිපත් කර ඇති බවත්,එය ඉතාමත් අගය කල යුතු බවත් ඒ සඳහා විශේෂයෙන්ම ස්තුතිය පල කරන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විසින් පවසා සිටින ලදී.මේ සඳහාද අත්සනක් යොදා එවන ලෙසත් ලේකම් මහතාට වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

තීරණ අංක 18

2022-12-31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා කල ගරු මහා සභාව නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.වාර්තාව මඟින් විකිණීමට නිර්දෙශ කරඇති ට්‍රැක්ටර් රථ 04 අළුත්වැඩියා කිරීම සුදුසු බවටද තීරණය කරන ලදී.

## 06. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම.

**i.** 2022-11-10 වන දින ගරු මහා සභාවේදී මිල දී ගැනීම සඳහා තීරණය කර ඇති මෝරුක්කුලිය සුනාමි ගම්මානය(නාමල් උයන) ව්‍යාපෘතියේ කැබලි අංක 37 ඉඩම් කොටස සම්බන්ධයෙන් community concern ආයතනය විසින් එවා ඇති ලිපිය සලකා බැලීම

මේ සඳහා ලක්ෂ 70 ගෙවීමට තමන් සූදානම් වූ බවත්,එවිට මේ පිළිබඳ වැඩි විමර්ශනයක් කල යුතු බවට ලේකම් මහතා විසින් පැවසූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.අපට ඉඩම් කැබලි දෙකක් ඔවුන් ලබා දී ඇති බවත්,මෙයද සභාවට ලබා දුන් ඉඩම් කැබැල්ලක්දැයි සොයා බැලිය යුතු බවට ගැටළුවක් පැමිණි බවත්,හිටපු සභාපති හෙක්ටර් අප්පුහාමි මහතාගේ කාලයේ සුනාමි ගම්මානය නිර්මාණය වූ බවත් ප්‍රකාශ කරන ලදී.එසේ නම් මුදල් නොගෙවන ලෙසට තමන් පැවසූ බවත්,පොදු ඉඩම් කොටසකට මුදල් දීම ගැටළුවක් වන බවත් ප්‍රකාශ කරන ලදී.මේ සඳහා වහාම විමර්ශනයක් කිරීමට ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා සමඟද සාකච්ඡා කර සියළුම ලිපි ලේඛණ ගෙන විමර්ශනය කල බවත් ප්‍රකාශ කරන ලදී.යම් උදවිය මැතිවරණ පොරොන්දුවක් සේ මෙය ඊළඟ ඡන්දයෙන් පසුව මිල දී ගන්නා බවට පවසාගෙන යන බවත්, මෙම ඉඩම් කැබැල්ල එම ජනතාවට ලබා දුන් ඉඩම් කැබැල්ලක් නොවේ නම් එය ඔවුන් සතු ඉඩම් කැබැල්ලක් නම් ඔප්පුව තිබේ නම් මෙය මිල දී ගැනීමට මහා සභාව මගින් තීරණය කල යුතු බවත් ප්‍රකාශ කරන ලදී.මෙම ලක්ෂ 70 ඇතුළත මෝරුක්කුලිය කොට්ඨාසයේ සංවර්ධණයට ගිය වසරේ වෙන් කල මුදලක්ද ඇතුළත් වී ඇති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.මේ සම්බන්ධයෙන් කොට්ඨාස භාර මන්ත්‍රීවරයාද සෑම විටම ප්‍රශ්න කරන බවත්,මෙම ඉඩම් කැබැල්ල අනිවාර්යයෙන්ම මිල දී ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

අදාල පාර්ශවය විසින් ඔප්පුව ඉදිරිපත් කර තිබේදැයිද ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා විමසා සිටින ලදී.

ඉදිරිපත් කර ඇති බවත්, කිරීමට ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා එය අධීක්ෂණය කර සම්පූර්ණ වැඩ කටයුත්ත සිදු කරඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙය දීර්ඝ කාලයක් ගෙන නොයා ගේට්ටු විවර කර මෙය ප්‍ර යෝජනායට ගනිමුයැයිද,එවිට අවශ්‍ය නම් කවුරුන් හෝ නඩු දමාවියැයිද මේ සඳහා නඩු දැමීමට නොහැකි බව තමන්ට පෙනී යන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම ලිපියේ “ ඉහත කරුණු අනුව ඉහත කී ඉඩම් කොටස සැලසුම් කර ඇති පරිදි මිලදී නොගන්නේ නම් ඒ පිළිබඳව නිසිපරිදි දන්වනමෙන් කාරුණිකව ඉල්ලා සිටිමි ” ලෙස සඳහන් වී ඇති බවත්,එවිට මෙය ගැනීමට පවසා ඇති බැවින් මෙහි තිබෙන ගැටළුව කුමක්දැයි ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

මෙය නිදහස් කරදෙන පැවසුවට මෙය රජයට තිබෙන කොටසක් බැවින් නිදහස් කර දිය නොහැකි බවට තමන පැවසූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.මෙයට තක්සේරු වටිනාකම ගෙන ඒ අනුව මිල දී ගන්නා බව තමන් පැවසූ බවත්, ජයකොඩි නඩුවෙන් බැට කෑ නිසා ඒ සඳහා ඇතුල් වීමට ගොස් දෙවරක්ම තමන් නැවත හැරී පැමිණි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී නීති ප්‍රශ්නයක් තිබෙන බවත්,මෙහි මුළු ප්‍රමාණය අක්කරයි රූඩ් 03 පර්චස් 07ක් බවත්,සභාවට ඉඩම් කැබැල්ලක් ගන්නේ නම් හෙක්ටයාර එකකට වඩා වැඩි විය යුතු බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.සභාවට ඉඩම් කෑල්ලක් ඉල්ලීමට හැකිදැයි විමසා සිටින ලදී.

“ අප ආයතනය විසින් ලබා දී ඇති ඉඩම් කොටස් සඳහා අවශ්‍ය පොදු පහසුකම් සඳහා කොටසක් වෙන්කර ඇති අතර එය කැබලි අංක 37 දරණ අප ආයතනය සතු ගොඩනැඟිල්ල පිහිටි ඉඩම කොටස නොවන බව අවධාරණය කර සිටිමි ” ලෙස සඳහන් කර ඇති බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

- ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව මෙම ආයතනය NGO ආයතනයක් බවත්,සුනාමියෙන් විපතට පත් වූ පිරිස පදිංචි කරවන ව්‍යාපෘතියක් බවත්,මෙම ඉඩම 2006දී පමණ කැබලි කල පිඹුරක් තිබෙන බවත්,මෙහිදී පර්චස් 05ක පමණ ඉඩම් කැබලි තිබෙන බවත්,ඉඩම් කැබලි තිස් ගණනක් තිබෙන බවත්,මෙහි ජනතාවගේ පොදු කටයුතු වලට වෙන් වන කොටසට නාගරික සංවර්ධන අධිකාරිය හෝ අතුරු ව්‍යාවස්ථාව බලාත්මක නොවන බවත් ප්‍රකාශ කරන ලදී. මෙය නිරීක්ෂණය කල පසුව ප්‍රජා ශාලාවද එකතු කර මේ වෙනුවෙන් ලෙස එක් පිඹුරකට එකතු කර පෙන්වා ඇති බවත්,මෙහි ව්‍යාපෘති වාර්තාවක් අනුමත කරගෙන තිබේදැයි තමන් විමසූ විට එලෙස වාර්තාවක් නොමැති බව පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්තුමියටද කතා කල බවත්,අනුමැතිය ඉල්ලාගෙන පැමිණියද අනුමැතිය ලබා නොදුන් බවට පවසා තිබූ බවත් එමෙන්ම හිටපු සභාපතිතුමාටද තමන් කතා කල බවත් එතුමා ඒ සඳහා අනුමැතිය ලබා දුන් බවත් නමුත් මෙය ප්‍රජා ශාලාවක් ලෙස පවත්වාගෙන යන ලෙස අනුමැතිය දුන් බව පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.එම ආයතනය සතුව අනුමැතිය තිබිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.එම කණ්ඩායම සභාවට පැමිණි බවත්,එම ප්‍රජා ශාලාව ජනතාව වෙනුවෙන් සකස් නොකල බව පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.එහිදී එසේ නම් මෙම පිඹුරට එය යා කලේ මන්දැයි තමන් විමසූ බවත් එහි අරමුණ තමන් විමසා සිටි බවත් ප්‍රකාශ කරන ලදී.

ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් මේ සඳහා පිළිතුරක් එවා ඇති බවත්,පොදු කටයුතු වලට දීර්ඝ කාලයක පටන් මෙය පොදු කටයුතු වලට භාවිතා කල බව එතුමිය විසින් පවසා ඇති බව ලේකම් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.ඔප්පුවක්ද මේ සඳහා ඇති බවත්,තක්සේරු වාර්තාවද මේ සඳහා ලැබී ඇති බවත්,මහා සභාවේ අනුමැතියද මේ සඳහා ලැබී ඇති බවත් නමුත් ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් මෙය පොදු කටයුතු

වලට භාවිතා කල බවට පවසන බවත් කෙදිනක හෝ මෙය මුදල් ලබා දී මිල දී ගන්නේ මන්දැයි ගැටළුව මතු වන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ප්‍රජා ශාලාවක් ඉදි කර ඇති මෙය පිට මිනිසෙකු පැමිණ මිල දී ගනීවිදැයිද, මෙය විකිණීමට හැකි වේවිදැයිද ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

මෙය භාවිතා කිරීමට ගියහොත් නඩුවකට යාමට සිදු වන බවත්,එසේ නොමැතිනම් අවශ්‍ය ලිපි ලේඛණ ඉදිරිපත් කරන තෙක් මෙම මුදල් තැන්පතුවක දමා එය භාවිතා කිරීමට ඔවුන් සමඟ සාකච්ඡා කර එකඟතාවයකට පැමිණීම සුදුසු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

වසර 15ක සිට මෙම දේපල සම්බන්ධයෙන් උනන්දුවක් නොවී දැන් එය විකිණීමට පැමිණෙන බව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය කොට්ඨාසයට සිදු වන අගතියක් බවත්,පසුගිය වසරේ මුදල්ද මෙහි තිබෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙය සභාවට භාවිතා කිරීමට හැකි බවත්,නමුත් කෙදිනකවත් අයිතියක් නොලැබෙන බවත්,එමෙන්ම ඉදි කිරීමක්ද සිදු කිරීමට නොහැකි බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා පවසා සිටින ලදී.

තමන් ඉඩමට ඇතුළත් වූ විට නඩුවක් ඔවුන් ගොණු කරන බවත්,මුදල් ලක්ෂ ගානක් වැය කිරීමට සිදු වන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඔවුන් නඩුව දැමූ පසුව ඒ සඳහා අපට කතා කිරීමට හැකි බව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව.....

එවකට සිටි සභාපතිතුමා මෙම ගැටළුවට පැටළුණ බවත්,NGO ආයතනය විසින් සුනාමි ගම්මානය සාදා මොරටුව ප්‍රදේශයේ පිරිසක් මෙහි ගෙනැවිත් පදිංචි කල බවත්,එවිට ඔවුන්ට ආගමික ස්ථාන නොමැති වූ බැවින් මෙම ප්‍රජා ශාලාවේ එම කටයුතු සිදු කරමින් සිටි බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධයෙන් කොට්ඨාස භාර මන්ත්‍රීවරයාද පැහැදිලි කිරීමක් සිදු කරන ලදී.

මේ සඳහා පලාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබා ගනිමුයැයි ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා පවසා සිටින ලදී.

අදාල නීතිඥවරියවද හමුවී සාකච්ඡා කර තොරතුරු ලබා ගෙන කටයුතු සිදු කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඔවුන්ගෙන් තොරතුරු ගැනීමට නොහැකි බවත්,එබැවින් අප තොරතුරු එකතු කරගනිමුයැයි ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා පවසා සිටින ලදී. 2023 පෙබරවාරි 08 වන දිනැතිව දන්කොටුව ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලෙසට ද ඉල්ලා සිටින ලදී.

ප්‍රාදේශීය ලේකම්තුමියගේ ලිපිය තමාට දැන් ලැබුණ බවත්,රජයේ පොදු දේපලක් ලෙස පරිහරණය කර ඇති බවට පවසා ඇති බවත් එබැවින් මේ සඳහා තහනම් නියෝගයක් ගන්නා ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ස්ථිර කරන ලදී.

තීරණ අංක 19
2022-11-10 වන දින ගරු මහා සභාවේදී මිල දී ගැනීම සඳහා තීරණය කර ඇති මෝරුක්කුලිය සුනාමි ගම්මානය(නාමල් උයන) ව්‍යාපෘතියේ කැබලි අංක 37 ඉඩම් කොටස සම්බන්ධයෙන් community concern ආයතනය විසින් එවා ඇති ලිපිය සම්බන්ධයෙන් සාකච්ඡා කල ගරු මහා සභාව මේ සඳහා පලාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් ගැනීම සුදුසු බව තීරණය කරන ලදී.

ii. දංකොටුව සෞඛ්‍ය කම්කරු නිවාස වල පදිංචිකරුවන්ට ඉඩමේ හිමිකම් ලබා දීම පිළිබඳ සාකච්ඡා කිරීම

මේ සඳහාද තීරණයක් ගත යුතු බවත්,මොවුන් දරුවන්ව පාසලට දැමීමට ගියත් ගැටළු මතු වන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව සුසාන භූමියට යාබදව මෙම ඉඩම තිබෙන බවත්,එය රජයෙන් මැනුම් කිරීමේදී මෙම ඉඩම වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව සතු ඉඩමක් ලෙස සඳහන් කර ඇති බවත් එසේ නොමැතිව වෙනත් අයිතියක් නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.එසේ නම් මෙම ඉඩම මැන පළමුව ප්‍රකාශන ඔප්පුවක් සකස් කර ගැනීමට සිදු වන බවත්,මොවුන්ට බදු ලබා දීමක් ලෙස හෝ ලබා දීමට සිදු වන බවත් ප්‍රකාශ කරන ලදී.

දරුවන්ව පාසල් වලට දැමීමේදී බදු ඔප්පුව වලංගු නොවන බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

මින් පෙර වතුර ටැංකිය අසල ඉඩමේ ප්‍රාදේශීය සභාව මඟින් චක්‍රලේඛණයක් ගසා කොටස් වශයෙන් ඔප්පු ලියා දී ඇති බවත්,එම වාතාවරණයට මෙය අදාල නොවේදැයිද ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

එහිදී අඩු කුලී නිවාස යෝජනා ක්‍රමය රජයෙන් එකල සිදු කල බවත්,ඉන්පසුව රජයෙන් චක්‍ර ලේඛයක් පැමිණ ඒවා රු.25.00ට අඩු ඒවා ඔවුන්ට ලියාදෙන ලෙසට පැමිණි බැවින් ඒවා එලෙස ලබා දී ඇති බවත්,මෙය අප සභාවේ කම්කරු පිරිස පදිංචි වී සිටින ස්ථානයක් බවත් මෙය එයට අදාල නොවන බවත් ලේකම් මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය එකම ඉඩම බවත්,අතීතයේ මඤ්ඤොක්කා හේන ඉඩම ලෙස මෙය සඳහන් වන බවත්,ලිපි ලේඛණ වල සුසාන භූමිය හා කම්කරු නිවාස කොටස අප සභාවට අයත් බවට ලියවී ඇති බවත්,සුසාන භූමිය සඳහා මෙහි ඉදිරි කොටස තිබෙන බවත් එයද ගැටළුවක් වන බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා පවසා සිටින ලදී.මෙහිදී අනන්‍යතාවයද තහවුරු කර ගන්නා ලෙසත්,අප ආයතනයේ සේවය කරන්නේද යන්න සොයා බලන ලෙසත් පවසා සිටින ලදී.

එහි පවුල් 15 පමණ සිටින බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.මෙහි සිටින පිරිසගේ තොරතුරු ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

මෙහි ඉඩ ප්‍රමාණය සම්බන්ධයෙන්ද ගරු මන්ත්‍රීවරුන් සාකච්ඡා කරන ලදී.

පසුගිය දිනවල තමන් ලේකම් මහතා සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල බවත්,මෙහි අනුරූපණ සටහනක් ලේකම්තුමිය විසින් ලේකම්මහතාට එවා ඇති බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.මෙහිදී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා නීතිඥවරයාලෙස සහසම්බන්ධ වූ බවත් ප්‍රකාශ කරන ලදී.දන්කොටුව-ගිරිඋල්ල මාර්ගයෙන් ඇතුල් වීමට ප්‍රෙවිශ මාර්ගයක් සකස් කර ගන්නා බවට එතුමිය වාචිකව එකඟ වූ බවත් නමුත් අනුරූප සටහනෙන් එවැන්නක් පෙන්වා නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.එම ඉඩම කෙරවල අප සෞඛ්‍ය කම්කරුවන්ට බෙදීමට එකඟ බව පවසන බවත්,ජල සම්පත් මණ්ඩලය ඉදි කල නිවාස යෝජනා ක්‍රමයද මුළු ඉතිහාසය තුලම සභාවෙන් අනුමැතිය ගත් බවත් ප්‍රකාශ කරන ලදී.වැඩ අධිකාරී මහතා,ලේකම් මහතා එකතුව මෙහි භූමිය වර්ණයෙන් වෙන් කර පෙන්වන ලෙසට පවසන ලෙසත් නැතිනම් නිලධාරීන් විවිධ අවස්ථා වලදී නිලධාරීන් විවිධ දේ පවසන බවත් ප්‍රකාශ කරන ලදී.

මීන් පෙරද මේ සම්බන්ධයෙන් කතා කල බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා පවසා සිටින ලදී.

නමුත් දැන් ඔවුන් වෙනස් වී ඇති බවත්,අද දින මේ සඳහා අනුමැතියක් ගත යුතු බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.එබැවින් රේඛීවකින්ම මෙය වෙන් කරන ලෙසට පවසා සිටින ලදී.

එය අනාගතයේදී දන්කොටුව ප්‍රාදේශීය සභාවක් බිහි වීමට තිබෙන ස්ථානය බවත්,එය වෙන් කර ගැනීමට අප මැනුම් කටයුතු සිදු කරමුයැයි ද ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා පවසා සිටින ලදී.

රජයේ මිනින්දොරුවන් දමා මෙය මැනුම් කටයුතු සිදු කිරීමට ප්‍රාදේශීය ලේකම්තුමිය කැමති බව ලේකම් මහතා ප්‍රකාශ කරන ලදී.

අපගේ මිනින්දෝරු මහතෙකු දමා මෙය මැනුම් කටයුතු සිදු කරමුයැයි ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා පවසා සිටින ලදී.මෙය වසර ගනනාවක සිට ඇදෙන ගැටළුවක් බවත් ප්‍රකාශ කරන ලදී.

රජයේ මිනින්දෝරුවන් දමා මැනුම් කටයුතු සිදු කලහොත් ප්‍රාදේශීය ලේකම් ඒ සඳහා බැදීමක් පවතින බවත්,නැතිනම් එය පිළිනොගන්නා බවත් ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මේ වන විට එකඟතාවයකට පැමිණි බව ලේකම් මහතා පවසා සිටින ලදී.

| |
|---|
| තීරණ අංක 20<br>දංකොටුව සෞඛ්‍ය කම්කරු නිවාස වල පදිංචිකරුවන්ට ඉඩමේ හිමිකම් ලබා දීම පිළිබඳ සාකච්ඡා කල අතර පළමුව මෙහි මැනුම් කටයුතු සිදු කිරීම සුදුසු බවටත්,භූමිය වෙන්කර පෙන්වන ලෙසත් තීරණය කරන ලදී. |

iii. සෞඛ්‍ය කොන්ත්‍රාත් සේවයේ යොදවා ඇති සේවකයින්ට ගෙවන මාසික දීමනාව සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා ඉදිරිපත් කරන ලදී.

| |
|---|
| තීරණ අංක 21<br>සේවයේ යොදවා ඇති සේවකයින් 80 දෙනෙකු සඳහා සහ වරිපනම් ඒකක යාවත්කාලීන කිරීම සඳහා බඳවාගෙන ඇති සේවකයින් 10 දෙනෙකු සඳහා 2023 අයවැය මඟින් එක් අයෙකුට දිනකට රු.1500.00ක දීමනාවක් ගෙවීම සඳහා මුදල් වෙන් කර ඇති බැවින් එය ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

**iv.** නයිනමඩම කෝප්සිටිය සඳහා විදුලි සැපයුම් ධාරිතාවය වැඩි කර ගැනීම සම්බන්ධයෙන් සීමාසහිත වෙන්නප්පුව විවිධ සේවා සමූපාකාර සමිතිය විසින් ඉදිරිපත් කර තිබෙන ලිපිය සලකා බැලීම

මේ සම්බන්ධයෙන් මුදල් කමිටුවේදී සාකච්ඡා කල බව ගරු මන්ත්‍රීවරුන් විසින් පවසා සිටින ලදී.

මුදල් කමිටුවේදී රු15,000.00ක් ලෙස සාකච්ඡා කල නමුත් මෙහි කඩ කාමර දෙකට රු.24,000.00ක මුදලක් අයකරනා බව ගරු සභාපතිතුමා විසින් පවසා සිටින ලදී. එම නිසා කඩකුලී මුදල් වැඩි නොකර ගෙවනු ලබන මුදලෙන් 50%ක මුදලක් විදුලි සැපයුම සඳහාද හිලව් කර දෙන ලෙසට ඉල්ලා ඇති බවත් ගරු සභාපතිතුමා විසින් පවසා සිටින ලදී.

මොවුන් පවසනුයේ රු.12,000.00ක මුදලක් මාසිකව අයකරන ලෙස යැයි ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථීරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ජේ.ඒ.ඩී.ඒ.පී.එස්.ජයසූරිය මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

එම මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව මෙහිදි විදුලි සැපයුමට වැය වන සම්පූර්ණ මුදලම ඔවුන් ගෙවා අවසන් කරන බවත්,ඔවුන්ගේ මාසික කඩ කුලිය වන රු.24,000.00ක මුදලින් 50%ක මුදලක් අප සභාවට ගෙවීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත්,ඉතිරි මුදල යම් නිශ්චිත කාලයකට අඩු කර එම මුදල විදුලි සැපයුම සඳහා හිලව් කරන ලෙසත් ඉල්ලා ඇති බව පවසා සිටින ලදී.

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් විසින් තොරතුරු විමසා සිටින ලදී.

අපට එම සමිතිය දීර්ඝ කාලයකට බැඳීමකට ලක් කිරීමට හැකිදැයි ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

මන්ත්‍රීවරුන් විසින් විවිධ අදහස් පල කරන ලදී.

මහජනතාවට සහයෝගය පිණිස මෙම වැඩ කටයුතු සමූපාකාරය මගින් සිදු කරගෙන යන බවත්,එවිට මෙවැනි සහයෝගය ලබා දීම සමූපාකාර ව්‍යාපාරයට සභාව මඟින් ඉටු කරන මහගු කටයුත්තක් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධයෙන් මුදල් කමිටුවේදී කතා කල බවත්,එම වාර්තාවද ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙහිදී එම යෝජනාව එම ආයතනට දැනුවූ බවත්,එවිට ඔවුන් නැවත යෝජනාවක් ඉදිරිපත් කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථීරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව මෙම කඩ කාමර දෙකක් ලබා දී ඇති බවත්,2021දී තක්සේරුවක් පැමිණ ඇති බවත්,එවිට කඩ කුලිය රු.24,000.00 බවට පත්වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.ඉන්පසුව ඔවුන්ගේ අවශ්‍යතාවය මත කඩ කාමර වල ප්‍රමාණයද වැඩි කරගෙන ඇති බවත් ,නව තක්සේරුවකට ගියහොත් තිබෙන තක්සේරුවට වඩා දෙගුණයක තක්සේරුවක් ලැබෙන බවත් ප්‍රකාශ කරන ලදී.මෙය ඔවුන්ගේ අවශ්‍යතාවයට සිදු ගෙන ඇති බවත්,මුදල් කමිටුවේ සාකච්ඡා කර ගෙන ඇති තීරණය ගැටළු සහගත වුවත් මෙය ඔවුන්ගේ පසින් සහනයක් බවත් තමන් විසින් ඔවුන්ට පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.

අළුත්වැඩියා කිරීමට අනුමැතියක් ගත් බව ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ප්‍රමාණය වැඩි වූ පසුව නැවතත් තක්සේරුවක් ගත යුතු බව ලේකම් මහතා විසින් පවසා සිටින ලදී.තක්සේරුව වසර 5කට වරක් ගන්නා බවත් පවසා සිටින ලදී.

මෙහි 90% පමන ඉදි කිරීම ඔවුන්ගේ වියදමින් සිදු කර ඇති බවත්,සභාව මඟින් ඉදි කර දුන් කඩ කාමර වලට තක්සේරුව වැඩි කිරීම ගැටළුවක් නොවන බවත්, ගොඩනැඟිල්ල සභාවට අයත් වත්කමක් බවත් වත්කම් වැඩි වීමක් සිදු වී ඇති බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ඒ සියල්ලටම පසුව තක්සේරුව වැඩි කලහොත් එය සමූපාකාරයට සිදු කරන අසාධාරණයක් බවත් ප්‍රකාශ කරන ලදී.

මිල වැඩි නොකර සිටීමට මුදල් කමිටුව තීරණ කර ඇති බව ලේකම් මහතා පවසා සිටින ලදී.

මේ සම්බන්ධයෙන් මුදල් කමිටුවේ සාකච්ඡා කල බවත්,ඉන් පසුව එය දැනුම් දීමෙන් පසුව නැවතත් ලිපියක් ලබා දී මෙලෙස සාධාරණයක් කරදෙන ලෙසත් සභාවේද සහයෝගය ඇතිව මහජනතාවට සේවය කරන බවත් ඔවුන් පැමිණ පැවසූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.ඉන්පසුව අවශ්‍යකරන තොරතුරු සමඟ නැවත මෙය මහා සභාවට යොමු කල බවත් ප්‍රකාශ කරන ලදී.අපට මෙය මිනිසුන්ට කරන සේවාවක් ලෙස හැඟෙන්නේ නම් එය ලබා දීමට කටයුතු කරමුයැයිද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

කෝප් සිටියේ අවශ්‍යතාවයට ඔවුන් ප්‍රමාණය විශාල කරගත් බවත්,ඔවුන්ගේ අවශ්‍යතාවට විදුලිය ද ලබා ගන්නා බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජොන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.අප සභාවද ජනතාවට සේවය කරන බවත් ඔවුන්ට සහනයක් ලෙස වසර 05ක් යන තෙක් නව තක්සේරුවක් ලබා නොදී සිටීමට තීරණය කල බවත් ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ජේ.ඒ.ඩී.ඒ.පී.එස්.ජයසූරිය මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

එම මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව ඔවුන් මෙම මුදල වියදම් කර සිදු කිරීමට කැමති බවත්,නමුත් කොමසාරිස්තුමා විසින් මේ සඳහා අනුමැතිය ලබා නොදෙන බවත් පවසා සිටින ලදී.එය සිදු කර ගැනීමට මේ සඳහා සහයෝගයක් ඔවුන් ඉල්ලන බවත් ප්‍රකාශ කරන ලදී.

අයවැයෙහි හිඟයට කුමක් සිදුවන්නේදැයි ගරු මන්ත්‍රී ඩබ්.ජොන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

අප සභාවේ වත්කම් වැඩිවුවද හරිනම් තක්සේරුකර එම නව තක්සේරු මුදල ලබා ගත යුතු බවත්,එයත් නොගෙන තවමත් සභාව සිටින බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.වසර 05ක් යනතෙක් තක්සේරු මුදල වැඩි නොකර සිටීම විශාල සහයෝගයක් බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රීවරුන් මෙහිදී විවිධ අදහස් පල කරන ලදී.

මෙම ගොඩනැඟිල්ල සඳහා බදු පදනම කෙතරම් කාලයකට තිබේදැයි ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විමසා සිටින ලදී.

එය තිස් වසරකට තිබෙන බව ජේ.ඒ.ඩී.ඒ.පී.එස්.ජයසූරිය මහතා පවසා සිටින ලදී.

කුලිය වැඩි කරනුයේ අප විසින්දැයිද නැවතත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විමසා සිටින ලදී.

අප විසින් තක්සේරුවට යැවිය යුතු බව ලේකම් මහතා පවසා සිටින ලදි.

එසේ නම් අවසන් තක්සේරුවට යවා තිබෙන්නේ කවදාදැයිද ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විමසා සිටින ලදී.

2021 බව ලේකම් මහතා පවසා සිටින ලදී.

මුදල් කමිටුවේදී රු.15,000 ලෙස පැවසූ බවත්,නමුත් රු.24,000 ලෙස පවසන බවත් ගරු මන්ත්‍රීවරුන් පවසා සිටින ලදී.

මෙය ආයතන දෙකක් බවත්,ඔවුන්ගේ ඉල්ලීමද සාධාරණ බවත්,එම ට්‍රාන්ස්ෆෝමරයද සභාවට අයත් වන බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

අදාල නිලධාරීන්ව ලේකම් මහතා අමතා මුදල් කමිටුවේ යෝජනාවට එකඟවන ලෙසට පවසා ඇති බවත්,ඔවුන් කැමති වී ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් වසර 5 දක්වා වැඩි නොකර සිටිමුයැයිද ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

නැවත තස්සේරුවක් කලහොත් මුදල වැඩි වන බව තමන් ඔවුන්ට පැවසූ බව ලේකම් මහතා පවසා සිටින ලදී.

එසේ නම් ඔවුන් වියදම් කරන දින සිට වසර 5ක් දක්වා තක්සේරුව වැඩි නොකර තබමුයැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

2023 වර්ෂයේ සිට 2028 දක්වා තක්සේරුව වැඩි නොකර තබමුයැයි ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

තමන් මෙහිදී සිතුවේ මහජනතාවට ලැබෙන සහනය පිළිබඳව බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.වෙන්නප්පුව කෝප් සිටියට දියුණු වීමට පහසුකම් ලබා දී ඇත්තේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව බවත් එය අවිවාදයෙන් යුතුව පැවසිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 22

මෙම ලිපිය සම්බන්ධයෙන් ගරු මහා සභාව විසින් සාකච්ඡා කරන ලදී.එහිදී අනෙකුත් කඩ කාමර වලට සාපේක්ෂව වැඩි මුදලක් එනම් රු.24,000.00 ක් වැනි මුදලක් කඩ කාමර දෙක සඳහාම අය කරන බව ඔවුන් විසින් ඉදිරිපත් කල ලිපියේ සඳහන් කර ඇති බවත්,එම නිසා කඩකුලී මුදල් වැඩි නොකර ගෙවනු ලබන මුදලෙන් 50%ක මුදලක් විදුලි සැපයුම සඳහාද හිලව් කර දෙන ලෙසට ඉල්ලා ඇති බවත් සාකච්ඡා විය. 2023 වර්ෂයේ සිට 2028 වන තෙක් තක්සේරු මුදල වැඩි නොකර සහනයක් ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

v. 2023 වර්ෂයේ මාර්ග සඳහා නාම පුවරු සෑදීමට මිල ගනන් කැඳවා නොමැති බවත්,දැනට පවතින මාර්ග වලට නාම පුවරු සකස් කිරීම සඳහා මිල ගණන් කැඳවා ඒවා නම් කර දෙන ලෙසට ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මාන්වෙල් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සලකා බැලීම

අනුමැතිය ලබා දී ඇති මාර්ග 15 පමණ නාම පුවරු සකස් කිරීමට තිබෙන බවත්,තාවකාලීවක ඒවා සකස් කිරීම නවතා ඇති බවත් සභාවෙන් යෝජනා කරන්නේ නම් ඒවා සකස් කර දෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මාස ගණනාවක සිට මෝටර් ග්‍රේඩරය ඉල්ලා ඇති බවත්,එය ඉක්මනින් ලබා දෙන ලෙසත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා පවසා සිටින ලදී.

සෙනොක් ආයතනය මඟින් මෝටර් ග්‍රේඩරය අළුත්වැඩියා කල යුතු බවත්,එම යන්ත්‍රය හෙට දින අළුත්වැඩියා කර දින දෙක තුනකට පසුව ලබා දෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

විදුලි අළුත්වැඩියාවේදී බීගන් බල්බ තවමත් ලබා නොදුන් බවත්,මෙය ඉතාමත් කඩිනමින් සිදු විය යුතු බවත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා පවසා සිටින ලදී.වයර් හා ස්විච්චි නොමැති බවටද පවසන බවත් ප්‍රකාශ කරන ලදී.

බීගන් බල්බ සමඟ හෙට දින විදුලි වාහනය එම කොට්ඨාසය යවන ලෙසට එම අංශය භාර මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාට ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

එමෙන්ම ඉඩම් සම්බන්ධයෙන්ද කතාකිරීමේදී කැරන්වත්තේ ඉඩමක් බදු දී ඇති බවත්,එහි පොල් කඩා ගැනීමටද ලබා දී ඇති බවත්,මේ සඳහා ගමේ විරෝධතාවයක් තිබෙන බවත්,අල්ලපු වැටේ පුද්ගලයාටම මෙය බදු දී ඇති බවත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා පවසා සිටින ලදී. දීර්ඝ කාලීන බෝග වගාවට බදු ලබා දිය නොහැකි බවත් ,ඔවුන් බුලත් වගා කරන බවත් ප්‍රකාශ කරන ලදී.

එම ඉඩම සම්බන්ධයෙන් පොදු පහසුකම් කමිටුවටද පැමිණි බවත්,මේ වසරේද වගා කර ඇති බවත්,මායිම් වෙන් කර දෙන ලෙසට ඔවුන් ඉල්ලූ බවත් ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

එම ඉඩමේ ගමට ජලය දෙන පොදු ළිඳද තිබෙන බවත්,මෙය ගැටළුවක් බවත් ,මෙහි බුලත් වගා කිරීමට හැකිදැයිද ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා විමසා සිටින ලදී.

පසුගිය කාලයේ ඉඩම් බදු දීමත් සමඟ බොහෝ පිරිසක් පැමිණ දිගු කාලීන බෝග වගාවට ඉඩම් බදු ලබා ගත් බවත් එම පුද්ගලයා ලබන වසරේදී ද මෙය ලබා ගැනීමට හැකිවේයැයි සිතා එලෙස වගා කරන්නට ඇතැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරනලදී.

මෙම පුද්ගලයා එය මායිම් දමා එම නිවසට යාමට පාරක් සකස් කර ගැනීමට උත්සාහ කරන බවත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා පවසා සිටින ලදී.වැඩිහිටි සමිතියකට හෝ පොදු දේකට මෙය ලබා දෙන ලෙසටද ඉල්ලා සිටින ලදී.

ටෙන්ඩර් කිරීමේදී අවශ්‍ය පුද්ගලයින්ව එවන ලෙසත් ,මෙය සම්පූර්ණයෙන්ම අධීක්ෂණය කර වාර්තාවක් ලබා ගන්නා ලෙසට වැඩ අධිකාරී මහතාට හා ලේකම් මහතාට ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

තීරණ අංක 23

2023 වර්ෂයේ මාර්ග සඳහා නාම පුවරු සෑදීමට මිල ගනන් කැඳවා නොමැති බවත්,දැනට පවතින මාර්ග වලට නාම පුවරු සකස් කිරීම සඳහා මිල ගණන් කැඳවා ඒවා නම් කර දීම සුදුසු බවට ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා විසින් සිදු කල යෝජනාව ගරු මහා සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**vi.** තෝප්පුතොට මංසන්ධියේ ඇති ප්‍රාදේශීය සභාව සතු ඉඩම සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන (කම්මල් නිෂ්පාදන ගම්මානය) සඳහා කොටසක් ලබා ගැනීම සම්බන්ධයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය මඟින් එවා ඇති ලිපිය සලකා බැලීම

ලක්ෂ 95ක මුදලක් මේ සඳහා ලැබී ඇති බවත්,ඒ සඳහා වයික්කාල ප්‍රදේශයේ කම්මල් කර්මාන්තය තෝරා ගෙන ඇති බවත්,දුනු ඇදීමට කර්මාන්ත ශාලාවක් ඉදි කර දෙන ලෙසට ඔවුන් ඉල්ලූ බවත් ගරු මන්ත්‍රී

ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.මේ සඳහා නුරාණි කර්මාන්ත ශාලාව අසල පොදු කටයුතු සඳහා වෙන් කල පර්චස් 90ක කොටසින් පර්චස් 30ක් ලබා දෙන ලෙසටද මෙය වටිනා ව්‍යාපෘතියක් බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.2023-02-02 වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලෙසටද ඉල්ලා සිටින ලදී.

මෙය බදු දීමට අවශ්‍ය නොවන බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

දැනට වගා කිරීමට බදු ක්‍රමයට ලබා දී ඇති බවත්,නමුත් මේ වන තෙක් වගා කර නොමැති බැවින් එම ඉඩමෙන් පර්චස් 30ක් මේ සඳහා ලබා දෙමුයැයිද ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම් මහතාට මේ පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව මෙය ඉඩම් කොටස් කිරීමෙන් ලැබුණ කොටසක් බැවින් එම කොටසේ සිටින පිරිසට භාවිතා කිරීම සඳහා ඉඩම් කොටසක් වෙන් කිරීම සාමාන්‍ය ක්‍රමය බවත්,මෙය දීර්ඝ කාලීන වැඩක් බැවින් එම පිරිසගේ විරෝධතා පැමිණිය හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී වසර 5ක් පමණ ගත වුවද තවමත් කවුරුත් පදිංචි වී නොමැති බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.මෙය කර්මාන්තපුරයට යාබද ඉඩමක් බවත් මෙය සුදුසුම ස්ථානයක් බවත් ප්‍රකාශ කරන ලදී.

මෙය කොමසාරිස්තුමාගේ අනුමැතියට යවමුයැයි ලේකම්මහතා ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන්ද අදහස් පල කරන ලදී.

තීරණ අංක 24

තෝප්පුතොට මංසන්ධියේ ඇති ප්‍රාදේශීය සභාව සතු ඉඩම සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන (කම්මල් නිෂ්පාදන ගම්මානය) සඳහා නුරාණි කර්මාන්ත ශාලාව අසල ඇති භූමියෙන් පර්චස් 30ක භූමි ප්‍රමාණයක් ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

VII. ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව තමන් පසුගිය සභා වාරයේදී හිටපු අමාත්‍ය ගරු පෙස්ටස් පෙරේරා මැතිතුමාගේ විදුලි බිල සම්බන්ධයෙන් විධිමත් වාර්තාවක් ඉදිරිපත් කරන බවට පැවසූ බවත් නමුත් අද දින වන විට එම තොරතුරු විධිමත්ව නොලැබුණ බවත් ඊළඟ සභා වාරයේදී එය ඉදිරිපත් කරන බවත් ප්‍රකාශ කරන ලදී.

න්‍යාය පත්‍රය අනුව සියළු වැඩ කටයුතු අවසන් වූ හෙයින් සියලු දෙනාටම ස්තුතිය පළ කරමින් ගරු සභාපතිතුමා විසින් ප.ව 2.30 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.